ශ්‍රී ලංකාවේ, විශාලතම විශ්‍රාමික පාරිතෝෂික අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල, 2013 වසරේත් අඛණ්ඩව ආයෝජනය මත ආකර්ෂණීය ප්‍රතිලාභයක් අරමුදලේ සුරක්ෂිතභාවය පවත්වා ගනිමින් සාමාජිකයන්ට හිමිකර දීම තුළින් ඔවුන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීමේ ඒකායන දර්ශනය යටතේ කටයුතු කරනු ලැබීය.

මෙම වසර සේවක අර්ථසාධක අරමුදලට තවත් විශේෂ වසරක් වන්නේ එහි ඉතිහාසයේ සේවක අර්ථසාධක අරමුදල ඉපැයූ වැඩිම ආදායම වන රු. බිලියන 136 ක ආදායමක් වාර්තා කිරීමත් සමගිනි.

පහල යන පොලී අනුපාතිකයන් හමුවේ, සියයට 11 ක ඉතා ආකර්ෂණීය පොලී අනුපාතයක් ප්‍රකාශයට පත් කිරීමට අරමුදලට හැකි වූ අතර ඉතා අඩු උද්දමනයක් පවතින වකවානුවක් තුළ සාමාජිකයන්ගේ මූර්ත ප්‍රතිලාභ අනුපාතය ඉහල අගයක් විය.



# පටුන


පිටුව

**1 කොටස**

| | |
|---|---|
| **දැක්ම හා මෙහෙවර** | 1 |
| **මුදල් මණ්ඩල සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමාගේ පණිවිඩය** | 2 |
| **කම්කරු කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය** | 4 |
| **කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු** | 6 |
| **මෙහෙයුම් තොරතුරු** | 8 |
| **නියාමන රාමුව** | 9 |
| **ආර්ථික සමාලෝචනය** | 13 |
| **සේ.අ.අ ප්‍රගති සමාලෝචනය** | 18 |

**2 කොටස**

මූල්‍ය ප්‍රකාශන

| | |
|---|---|
| ආදායම් හා වියදම් ප්‍රකාශනය | 27 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 28 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 29 |
| ලැබීම් හා ගෙවීම් ගිණුම | 30 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 31 |
| ආයෝජන ප්‍රකාශනය | 32 |
| හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයින්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය | 33 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 34 |

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අදාළ සටහන්

| | | |
|---|---|---|
| 1. | පොලී ආදායම් | 41 |
| 2. | ලාභාංශ ආදායම | 41 |
| 3. | උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ / (පාඩු) | 41 |
| 4. | ක්‍රමක්ෂය ලාභ | 42 |
| 5. | ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් | 42 |
| | වලින් ලත් ශුද්ධ ආදායම | 42 |
| 6. | වෙනත් ආදායම් | |
| 7. | මුළු මෙහෙයුම් වියදම් | 42 |
| 8. | ආදායම් බදු වියදම | 43 |
| 9. | විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් | 43 |

මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශනයට අදාළ සටහන්

| | | |
|---|---|---|
| 10. | දේපළ, පිරියත හා උපකරණ | 44 |
| 11. | ප්‍රාග්ධන නොනිමි වැඩ | 45 |
| 12. | අස්පෘශ්‍ය වත්කම් | 45 |
| 13. | මූල්‍ය වත්කම් | 46 |
| 14. | වෙනත් ජංගම වත්කම් / ලැබිය යුතු ශේෂය | 47 |
| 15. | මුදල් හා මුදල් සමාන වත්කම් | 47 |
| 16. | ණය හිමියෝ | 47 |
| 17. | වෙනත් ජංගම වගකීම් | 48 |

18. සාමාජික ශේෂ 49
19. සංචිත 49

ලැබීම් හා ගෙවීම් ගිණුමට අදාළ සටහන්

20. ලැබීම් 50
21. ගෙවීම් 51

ආයෝජන ප්‍රකාශනයට අදාළ සටහන්

22. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් 52
23. විකිණීම සඳහා ඇති වත්කම් 53
24. කල්පිරීම තෙක් තබාගත් ආයෝජන 57
25. ණය හා ලැබිය යුතු දෑ 60
26. ආයෝජනයන්හි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 61
27. ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය 62

**විගණකාධිපති වාර්තාව** 64

## 3 කොටස

**සංඛ්‍යා සටහන්**

1. ආයෝජන, කල්පිරීම් හා ආයෝජන මත ප්‍රතිලාභය (1982-2013) 243
2. සාමාජික ශේෂ මත ප්‍රතිලාභ අනුපාතිකය (1982-2013) 244
3. සාමාජික ශේෂ, සාමාජික ශේෂ මත පොලී සහ සඵල පොලී අනුපාතිකය (1982-2013) 245
4. ආයෝජන කළඹ පිළිබඳ ප්‍රකාශනය (1982-2013) 246
5. සංක්ෂිප්ත මුදල් ප්‍රවාහය (මුදල් මණ්ඩලය) (1982-2013) 247
6. සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශනය (1992-2013) 250

# අපගේ දැක්ම

සමෘද්ධිමත් විශ්‍රාම දිවියක් සාමාජිකයන් වෙත ලබා දීමට හැකිවන අයුරින් කලාපයේ වඩාත් විශ්වාසදායී විශ්‍රාම අරමුදල බවට පත්වීම.

# අපගේ මෙහෙවර

නව්‍ය හා විචක්ෂණශීලී කළමනාකරණය තුලින් ඉහළම විශ්‍රාම ප්‍රතිලාභයක් හා කාර්යක්ෂම සේවාවක් සාමාජිකයන් වෙත ලබාදීම.

## මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය



ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ.) 2013 වාර්ෂික වාර්තාව මා ඉදිරිපත් කරන්නේ ඉතා සතුටිනි.

සේවක අර්ථසාධක අරමුදල බොහෝ වැදගත් සන්ධිස්ථානයන් පසුකරමින් එහි ශක්තිමත් කාර්යසාධනය 2013 වසරේදී අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. එහි මුළු වත්කම්හි වටිනාකම රු. ට්‍රිලියන 1.3 ක් දක්වා වර්ධනය වූ අතර රු. බිලියන 136 ක වාර්තාගත ඉහළම වාර්ෂික ආයෝජන ආදායම වාර්තා කරන ලදී. සේ.අ.අ. සමස්ථ ආයෝජන කළඹ මත සියයට 11.54 ක ඉතා සිත්ගන්නා සුළු ප්‍රතිලාභ අනුපාතිකයක් මගින් අරමුදලේ වටිනාකම වර්ධනය කරගත් අතර, ඒ අනුව සියයට 11.0 සැලකිය යුතු පොලී අනුපාතයක් සාමාජික ශේෂ මත ගෙවීමට අරමුදලට හැකි විය. සේ.අ.අ. මගින් අත්කරගනු ලැබූ මෙම ප්‍රගතිය ඉතා ප්‍රසංශනීය වන්නේ, 2013 වසරේ පැවති අඩු පොලී අනුපාතිකය සහ පසුබැමට ලක් වූ කොටස් වෙළෙඳපොල වාතාවරණයක් යටතේ මෙම කර්තව්‍යය ඉටු කරන ලද බැවිනි. එමගින් නැවත වරක් පෙන්නුම් කරනුයේ අරමුදලේ ශක්තිමත් අරමුදල් කළමනාකරණය සහ මනා ආයෝජන ප්‍රතිපත්ති සහ පරිචයන්ය. අවදානම් හා ප්‍රතිලාභ අතර වූ පරස්පර භාවය මනා ලෙස කළමනාකරණය කිරීම මගින් සේ.අ.අ. එහි අතිරික්ත අරමුදල් මුලිකව රජයේ සුරැකුම්පත්වල ආයෝජන කරන අතර, කොටස් හා සාංගමික ණය උපකරණයන් හරහා ආයෝජන විවිධාංගීකරණය කරන ලදී. මෙම වාතාවරණය තුළ රටෙහි විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල ලෙස අරමුදලේ ආයෝජනය දීර්ඝකාලීන දැක්මක් සහිතව සිදු කරනු ලැබූ බැවින් ප්‍රතිලාභයන් හි ඇති කාලීන උච්චාවචනයන් මධ්‍යයේ වුවද අඛණ්ඩව 8 වන වරටත් සියයට 10 වඩා වැඩි ස්ථිරසාර පොලී අනුපාතිකයක් සාමාජිකයන්ට ලබාදීමට හැකි විය.

ශ්‍රී ලංකාවේ විශාල ආර්ථික විභවයන් සැලකීමේදී ඉදිරි වසරවල අරමුදල තවදුරටත් වර්ධනය වනු බවට අපේක්ෂා කළ හැක. ඒ සමඟම ජනගහනයේ වයස්ගත වීම හේතුවෙන් ශ්‍රම වෙළඳපොලට නව එකතුවන්නන්ගේ සංඛ්‍යාව අඩුවීමට ඉඩ ඇත. මෙම නව තත්ත්වයන් අපේක්ෂා කරමින් ගතික ආයතනයක් වශයෙන් සේ.අ.අ. එහි අරමුදල් කළමනාකාරණ උපයාමාර්ගයන්, පරිපාලනය මෙන්ම අවදානම් කළමනාකාරීත්ව පරිචයන් හා කාර්ය පටිපාටීන් වෙනස් කරනු ලැබුවේ අරමුදල තමන්ට අවශ්‍ය හැකියාවන්, උපකරණ, සම්පත්, පද්ධති හා යටිතල ව්‍යුහ වලින් සන්නද්ධ වීම සඳහාය. එමනිසා, සේ.අ.අ. ඉදිරි වසරවලදී රටෙහි සිදුවන ආර්ථික සංවර්ධනයේ නිසි ඵල ලබා ගැනීමට මනා සූදානමක් සහිත සහ අරමුදල කාර්යක්ෂමව හා සඵලදායීව කළමනාකරණය කරමින් එහි භාරකාරිත්ව වගකීම නොපිරිහෙලා ඉටු කිරීම පිළිබඳව අපගේ සාමාජිකයන්ට සහතික වෙමි.

තම සාමාජිකයන්ට ඉතා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින්, සේ.අ.අ. වසර තුළ දී නව ව්‍යාපෘති රැසක් දියත් කරන ලදී. සේවායෝජකයින්ගෙන් සේ.අ.අ. දායක මුදල් රැස් කිරීම නව්‍යකරණය කිරීමේ ක්‍රමයක් ලෙස අනිවාර්ය විද්‍යුත් දත්ත එක්රැස්කිරීමේ රෙගුලාසීන් ගැසට් කිරීම මෙම වසරේ දී සිදු විය. මෙහිදී සේවකයින් 50 ට වැඩියෙන් සිටින සෑම සේවායෝජකයෙක්ම දායක මුදල් හා සාමාජික තොරතුරු විද්‍යුත් ක්‍රමය මගින් මාසිකව ලැබීමට සැලැස්විය යුතුය. වසර අවසානය වන විට සුදුසකම්ලත් සේවායෝජකයන්ගෙන් සියයට 41ක් මෙහි සාර්ථකව

ලියාපදිංචි වූ අතර, සාමාජික ගිණුම් ඉතා ඉක්මනින් බැර කිරීම හා කාර්යක්ෂම ලෙස සාමාජික ගිණුම් කළමනාකාරීත්වය තුළින් සේ.අ.අ. ට තම සාමාජිකයන්ට වඩා හොඳ සේවාවක් ලබාදීමට හැකි විය.

අරමුදල මගින් ගන්නා ලද තවත් සුවිශේෂී පියවරක් වූ පිළිබිඹු ඡායා පිටපත් ව්‍යාපෘතිය (Image Scanning Project) මෙම වසර තුලදීත් ප්‍රගතියක් පෙන්වූයේ විවිධ පුණරීක්ෂණයන්ට භාජනය වෙමිනි. දැනට සේ.අ.අරමුදලේ පවතින කඩදාසි මත පදනම් වූ ක්‍රමය අවම ලේඛන සහිත විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීමේ ක්‍රමයක් බවට පත් කිරීම මෙම ක්‍රමයේ අරමුණයි. දැනට පවතින මිලියන සංඛ්‍යාත සාමාජිකයන්ට අදාළ ඉතා විශාල ලියකියවිලි ප්‍රමාණයක්, විද්‍යුත් ක්‍රමයට පරිවර්තනය කිරීම මේ යටතේ සිදු කරයි. මෙම යෝජනා ක්‍රමය අවසාන වීමත් සමඟ ලියකියවිලි කළමනාකරණ ක්‍රමය (Document Management System) හා දැනට පවතින සේ.අ.අ. පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධ කරමින් ඉලෙක්ට්‍රොනික් දත්ත මැදිරියක් ස්ථාපනය කරනු ලැබේ. මෙමඟින් අරමුදලේ ඵලදායීතාව ඉතා විශාල ලෙස ඉහළ නැංවෙයි.

තවදුරටත්, සේ.අ.අරමුදලේ සේවාවන් පිළිබඳව සාමාජිකයින්ගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන් 2013 වසරේ දීත් පෙර පරිදිම සිදුකරන ලදී. විද්‍යුත් වාර්තා පද්ධතිය, සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රමය හා වෙනත් සාමාජිකයන් සම්බන්ධ සේවාවන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා ජංගම සේවාවන් අරමුදලට විවිධාකාරයෙන් සම්බන්ධ පාර්ශවයන් ඉලක්ක කරගනිමින් රටේ විවිධ ප්‍රදේශයන්හි පවත්වන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග සහයෝගීත්වයෙන් කටයුතු කරමින් මෙය තවදුරටත් දියුණු කිරීමට සේ.අ.අ. ට හැකි විය.

මෙම වාතාවරණ තුළ, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ, සේ.අ. අරමුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ප්‍රයත්නයන් සහ කැපවීම් වෙනුවෙන් මුදල් මණ්ඩලය තම ප්‍රශංසාව පිරිනමමු.

එසේම, අරමුදලේ සියළුම සාමාජිකයන් හා සේවායෝජකයන් අරමුදල සාර්ථකත්වය කරා යන ගමන ශක්තිමත් කිරීම සඳහා අරමුදල මත ඔවුන් තබා ඇති නොසැලෙන විශ්වාසයට මුදල් මණ්ඩලයේ අවංක කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමු.



**අර්ජුන මහේන්ද්‍රන්**

අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් මණ්ඩලයේ සභාපති

# කම්කරු කොමසාරිස් ජනරාල්තුමියගේ පණිවිඩය



ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය විසින් 2013 වර්ෂය තුල සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කරමින් 2013 වාර්ෂික වාර්තාව නිකුත් කිරීම පිළිබඳව මාගේ සුභාශිංසනය පිරිනමමි.

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ශ්‍රමිකයන් හට විශ්‍රාම දිවියේ දී ආර්ථික තත්ත්වය සුරක්ෂිත කිරීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන සේවක අර්ථසාධක අරමුදල ස්ථාපනය කරන ලද අතර මේ වනවිට එය ශ්‍රී ලංකාවේ පවතින දැවැන්තම සමාජ ආරක්ෂණ ක්‍රමය බවට පත්ව ඇත.

2012 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කය තුල ආරම්භ කරන ලද අයකිරීම් අධීක්ෂණ පරිගණක පද්ධතියේ කටයුතු 2013 වර්ෂය තුලදී දිවයින පුරා දිස්ත්‍රික් කම්කරු කාර්යාල බහුතරයක ස්ථාපනය කර ඇත.

එමෙන්ම මියගිය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම් කටයුතු කලාප කම්කරු කාර්යාල හරහා දිවයින පුරා විමධ්‍යගත කිරීම 2013 වර්ෂයේ දී සාර්ථකව සිදු කර ඇත.

2012 වර්ෂයේ දී ආරම්භ කරන ලද සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ ඇඟිලි සලකුණු ඩිජිටල් ක්‍රමයට ලබාගෙන දත්ත ගබඩාවක් සකස් කිරීමේ ව්‍යාපෘතියේ දී දිවයින පුරා ව්‍යාප්තව සිටින සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ පහසුව සඳහා සහ එම කාර්යය කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා මූලික පියවරක් ලෙස 2013 වසරේ දී දිස්ත්‍රික් කම්කරු කාර්යාල කිහිපයක ඇඟිලි සලකුණු ඩිජිටල් ක්‍රමයට ලබා ගැනීමේ පද්ධති ස්ථාපිත කර ඇත. ඉදිරියේ දී සියළුම දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල ස්ථාපනය කිරීමට අපේක්ෂිතය.

සේව්‍ය සේවක දෙපාර්ශවය අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යාවස්ථාපිත වගකීම් නිසි පරිදි ඉටු කිරීම සඳහා මහඟු දායකත්වයක් ලබා දෙන කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් හා සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සාර්ථකව කිරීම සඳහා දායකත්වය ලබාදෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වෙත මාගේ කෘතඥතාවය පළ කරමි.

සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව සේව්‍ය සේවක දෙපාර්ශ්වයන්ටත් පරිපාලන හා මූල්‍ය ආයතනවලට සම්බන්ධ නිලධාරීන්ටත් මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය කරන අනෙකුත් පාර්ශ්වයන්ටත් මහෝපකාරී වනු ඇතැයි අපේක්ෂා කරමි.

**පර්ල් වීරසිංහ මිය**

කම්කරු කොමසාරිස් ජනරාල්

# කාර්ය සාධනය - වැදගත් තොරතුරු

**වගුව 1 — මූල්‍ය තොරතුරු**

රු. මිලියන

| අයිතමය | 2012 | 2013 |
|---|---|---|
| දායක මුදල් | 70,171 | 80,484 |
| ප්‍රතිලාභ ගෙවීම් | 48,712 | 50,243 |
| ශුද්ධ දායක මුදල් | 21,459 | 30,241 |
| දළ ආදායම | 121,413 | 136,657 |
| ශුද්ධ ආදායම | 111,829 | 125,610 |
| සංචිත සඳහා මාරු කිරීම් | 5,700 | 3,700 |
| සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලිය | 115,771 | 126,992 |
| සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී ප්‍රතිශතය (%) | 11.50 | 11.00 |
| සාමාන්‍ය ආයෝජන මත වූ ප්‍රතිලාභ ප්‍රතිශතය (%) | 11.61 | 11.54 |
| මෙහෙයුම් වියදම් | 948 | 979 |
| මෙහෙයුම් වියදම් මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස (%) | 0.78 | 0.72 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 1 — අරමුදලේ වර්ධනය**




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| මුළු ශුද්ධ වත්කම් (රු. බි.) | 770 | 900 | 1,018 | 1,144 | 1,300 |
| වර්ධන අනුපාතිකය (%) | 17.8 | 16.9 | 13.1 | 12.4 | 13.6 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2 — සාමාජිකයන්ගේ අවසාන ශේෂ මත ගෙවූ පොලිය**




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| පොලී ගෙවීම් (රු. බි.) | 90.7 | 96.3 | 101.3 | 115.8 | 127.0 |
| පොලී අනුපාතිකය (%) | 13.8 | 12.5 | 11.5 | 11.5 | 11.0 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3** — **දායක මුදල්, ප්‍රතිලාභ ගෙවීම් සහ ශුද්ධ දායක මුදල්**




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| දායක මුදල් (රු.බි) | 48.7 | 54.8 | 61.9 | 70.2 | 80.5 |
| ප්‍රතිලාභ ගෙවීම් (රු.බි) | 31.9 | 34.9 | 47.3 | 48.7 | 50.2 |
| ශුද්ධ දයක මුදල් (රු.බි) | 16.8 | 19.9 | 14.6 | 21.5 | 30.2 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4** — **ප්‍රතිලාභ ගෙවීම සඳහා පවතින ද්‍රවශීලතාවය**




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| මුළු ගලාඒම් | 373.3 | 447.8 | 531.7 | 558.8 | 848.4 |
| මුළු ගලායාම් | 44.2 | 44.3 | 64.4 | 70.9 | 85.1 |
| ද්‍රවශීලතා ආවරණය (මුළු ගලාඒම්/මුළු ගලා යාම්) | 8.5 | 10.1 | 8.3 | 7.9 | 10.0 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5** — **සාමාජිකයන් සඳහා වූ සඵල ප්‍රතිලාභ අනුපාතය සහ වෙළෙඳපොළ පොළී අනුපාතික**




මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6** — **සාමාන්‍ය ආයෝජන කළඹ මත ප්‍රතිලාභය**




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| දළ ආයෝජන ආදායම | 109.4 | 120.9 | 115.8 | 121.4 | 136.3 |
| ආයෝජන මත ප්‍රතිලාභය (%) | 16.0 | 15.1 | 12.5 | 11.6 | 11.5 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7** — **ආයෝජන කළඹෙහි සංයුතිය**




| කාණ්ඩය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| රජයේ සුරැකුම්පත් | 97.1 | 92.2 | 91.1 | 93.6 | 92.5 |
| කොටස් | 1.3 | 7.0 | 7.7 | 5.4 | 5.8 |
| ණයකර සහ වෙනත් | 1.6 | 0.9 | 1.2 | 1.0 | 1.7 |

රජයේ සුරැකුම්පත් — කොටස් — ණයකර සහ වෙනත්

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 8** — **සාමාජික ගිණුම් සංඛ්‍යාව**




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| දායක | 2.0 | 2.2 | 2.2 | 2.3 | 2.4 |
| දායක නොවන | 10.7 | 11.2 | 11.8 | 12.3 | 12.8 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## මෙහෙයුම් තොරතුරු

1 සියයට 11.0 ක පොලී ප්‍රතිශතයක් සාමාජිකයන්ට ගෙවන ලදී.

2 සමස්ථ සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 15.2 ක් දක්වා වර්ධනය විය.

3 දායක මුදල් ගෙවනු ලබන සාමාජික සංඛ්‍යාව මිලියන 2.3 සිට මිලියන 2.4 දක්වා වර්ධනය විය.

4 අරමුදලේ වටිනාකම රු. බිලියන 1,300 ක් දක්වා වර්ධනය විය.

5 සාමාජිකයන් 114,114 දෙනෙකුට විශ්‍රාම ප්‍රතිලාභ රු. මිලියන 50,243 ක් ගෙවන ලදී.

6 ණය දෙන ආයතන වලින් සේ.අ.අ. ශේෂයන් ඇපයට තබා නිවාස ණය ලබා ගැනීම පිණිස සාමාජිකයන් 16,268 ක් සඳහා ඇප සහතික නිකුත් කරන ලදී.

7 ඇල්මැති පර්ශවයන්ගේ සම්බන්ධතා ශක්තිමත් කිරීම පිණිස විවිධ ප්‍රදේශවල සාමාජිකයන්ට දැනුවත් කිරීමේ වැඩසටහන් හා ජංගම සේවා 09 ක් ක්‍රියාත්මක කරන ලදී.

8 සේ.අ.අ. සාමාජික දායක මුදල් බැංකු වෙබ් අඩවි හරහා අන්තර්ජාල ගෙවීම් ක්‍රම මගින් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු 03 ක් පත්කරන ලදී.

9 අවම ලේඛන සහිත (near paperless) ආයතනයක් කිරීම සඳහා සාමාජිකයන්ට අදාළ මිලියන 7.5 ක් පමණ ලේඛන පිලිබිඹු ඡායා පිටපත් කිරීමේ වැඩ සටහනක් අරඹන ලදී.

10 නම් හා ගිණුම් සංශෝධනයන් සහ ශේෂ විමසීම් ආදී වූ මහජන විමසීම් 222,498 ක් සපුරාලීමට සමත් විය.

# නියාමන රාමුව

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවානියුක්තයින් වෙත විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමේ අරමුණ පෙරදැරි කොට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධිවිධාන වලට අනුව, අරමුදලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කම්කරු කොමසාරිස්තුමා කටයුතු කරන අතර, අරමුදලෙහි භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල හා කාර්යයන් හා වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. පනත මඟින් මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල, කාර්යයන් හා වගකීම් ක්‍රියාත්මක කරනු ලබන්නේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මඟිනි.

සේවක අර්ථසාධක අරමුදල, අනිවාර්ය නිශ්චිත දායක මුදල් මත පදනම් වූ විශ්‍රාම පාරිතෝෂික අරමුදලකි. අරමුදලට අනිවාර්ය අවම මාසික දායක මුදල් ප්‍රමාණය අරමුදලෙහි සාමාජිකයකුගේ මාසික දළ වැටුපෙන් සියයට 20 කි. සාමාජිකයාගේ දළ මාසික වැටුපෙන් සියයට 12 ක ප්‍රතිශතයකට සමාන මුදලක් සේවායෝජකයා විසින් ද, සියයට 08 ක ප්‍රමාණයක් සේවා නියුක්තිකයා (සාමාජිකයා) විසින් ද දායකත්වය ලෙස දැරිය යුතු වේ.

ගෙවිය යුතු දායක මුදල් සහ තම සේවා නියුක්තිකයන් පිළිබඳ අදාළ තොරතුරු අදාළ කාලසීමාවක් තුළ එවීමට සේවායෝජකයා බැඳී සිටී. සේවක සංඛ්‍යාව 150 දෙනෙකුට වඩා අඩු සේවායෝජකයින් (''සී''කාණ්ඩය) තම දායක මුදල් හා අදාළ විස්තර (''සී'' පෝරමය) මාසිකව එවිය යුතු වන අතර, සේවක සංඛ්‍යාව 150 දෙනෙකුට වැඩි ආයතනවල සේවායෝජකයන් (''සී3'' කාණ්ඩය) අදාළ තම දායක මුදල් මාසිකව එවා අදාළ විස්තර වාර්තා (''සී3'' පෝරම) අර්ධ වාර්ෂිකව එවිය යුතුය. නමුත් 2012 වසරේ දී පනතේ කරනු ලැබූ සංශෝධනය අනුව, අවම සේවක සංඛ්‍යාව 50 ක් සිටින සියලුම සේවායෝජකයන් විසින් මාසික දායක මුදල් හා දායක මුදල් විස්තර විද්‍යුත් මාධ්‍ය තුළින් මාසිකව එවිය යුතුය.

අරමුදලෙහි සාමාජිකයන් විශ්‍රාම යන වයස සම්පූර්ණ කළවිට (පිරිමින් වයස 55 සම්පූර්ණවීම හා කාන්තාවන් වයස 50 සම්පූර්ණ වීම) තම ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. තවද ස්ථිරව රට හැරයාම, පූර්ණ දුබලතාවයට පත්වීම, විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම (කාන්තාවන් සඳහා පමණි) සහ විශ්‍රාම වැටුප් ලබන රජයේ රැකියාවකට පිවිසීම යන හේතු ද ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමට ඇති සුදුසුකම් වේ. මියගිය සාමාජිකයන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් මියගිය සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුස්සෝ වෙති. විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව, තම සාමාජික ශේෂය ඇපයට තබා අනුමත ණය දෙන ආයතන පහකින් නිවාස ණය ලබා ගැනීමට ද අරමුදල පහසුකම් සපයා ඇත.

## කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය

- සේවායෝජකයන් හා සේවානියුක්තිකයන් ලියාපදිංචි කිරීම.
- පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම සහතික කර ගැනීම පිණිස අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම සහ දායක මුදල් නිසි ලෙස ගෙවීම පැහැර හැරීම සම්බන්ධව නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ප්‍රමාද වී ගෙවනු ලබන දායක මුදල් සම්බන්ධයෙන් සේවායෝජකයන්ගෙන් දඩ මුදල් අයකර ගැනීම.
- ප්‍රතිලාභ හිමිකම් සඳහා වූ අයදුම්පත් භාර ගැනීම හා එම අයදුම්පත්වලට අදාළව ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධ තීරණ ලිපි මහ බැංකුවට නිකුත් කිරීම.
- සාමාජිකයන්ගේ පෙර පැවති සාමාජික ගිණුම් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීම.
- සාමාජිකයින්ට තම ගිණුම් ශේෂ ඇපයට තබා අනුමත ණය දෙන ආයතන වලින් නිවාස ණය ලබා ගැනීමට හැකිවන පරිදි අදාළ නිවාස ණය අයදුම්පත් අනුමත කිරීම.

## මුදල් මණ්ඩලයේ කාර්යභාරය

සාමාජික දායක මුදල්, අධිභාර සහ ආදායම් රැස්කිරීම.

සාමාජික ගිණුම් පවත්වාගෙන යාම.

අරමුදලේ ආරක්ෂාව තහවුරු කරන අතරම, සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභ අත්කර දීම අරමුණු කොට අරමුදල සතු අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම.

මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගැනීමෙන් අනතුරුව සාමාජික ගිණුම්වලට බැර කිරීම.

අරමුදලේ වාර්ෂික ගිණුම් සැකසීම හා සාමාජිකයින් වෙත වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම.

කම්කරු කොමසාරිස් විසින් ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාල ප්‍රතිලාභ ගෙවීම.

නිවාස ණය ලබාගැනීම සඳහා අයදුම්කොට ඇති සාමාජිකයින් වෙනුවෙන් ගිණුම් ශේෂ සහතික අනුමත ණය දෙන ආයතනවලට නිකුත් කිරීම.

යම් ගිණුම් වර්ෂයක් අවසන් වී තෙමසක් ඇතුළත අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන සහ ආයෝජන ප්‍රකාශන වැනි තොරතුරු ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයාටත්, ගරු මුදල් ඇමතිවරයාටත් ඉදිරිපත් කිරීම.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම - 2013.12.31 දිනට

සේවක අර්ථසාධක අරමුදල් අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

| නම | තනතුර | අංශය |
|---|---|---|
| ඩී.පී.කේ.ආර්. වීරකෝන් මයා | කම්කරු කොමසාරිස් | |
| වී. උමාමගල් මිය | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | ප්‍රතිලාභ ඉල්ලීම් |
| පී.එච්.පී.අයි. බණ්ඩාර මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| කේ.පී.එච්. ඉන්ද්‍රානි මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| ඩබ්.ආර්.ඒ.එම්. රත්නායක මයා | සහකාර කම්කරු කොමසාරිස් | |
| කේ.එල්.කේ. පෙරේරා මයා | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | අයකර ගැනීම් අංශය |
| ඩී.එච්.ටී. දේශප්‍රිය මයා | සහකාර කම්කරු කොමසාරිස් | |
| බී. වසන්තන් මයා | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | පරිගණක අංශය |
| ඩී.වී.ටී.පී. දයානන්ද මිය | සහකාර කම්කරු කොමසාරිස් | පාලන අංශය |
| එන්.එම්.වයි. තුෂාරි මිය | සහකාර කම්කරු කොමසාරිස් | ප්‍රතිලාභ ඉල්ලීම් - එල් |
| ජී.ඒ.ඩී.ආර්. ගයනි මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| එම්.එෆ්.ජී. සමරවීර මයා | සහකාර කම්කරු කොමසාරිස් | මධ්‍යම ලිපි ගොනු අංශය |

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

| නම | තනතුර | අංශය |
|---|---|---|
| පී.ඩබ්.ඩී.එන්.ආර්. රුද්‍රිගු මයා | අධිකාරී | |
| සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මිය | අතිරේක අධිකාරී | |
| ඒ.ජී.යූ. තිලකරත්න මයා | නියෝජ්‍ය අධිකාරී | |
| එස්.ඒ.එල්. මුතුකුමාර මයා | නියෝජ්‍ය අධිකාරී | |
| ජේ.ඩී.එස්.ජේ. නානායක්කාර මයා | නියෝජ්‍ය අධිකාරී | |
| එස්.එන්. තිලකවර්ධන මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඕ.කේ.එස්.පී. බණ්ඩාර මිය | සහකාර අධිකාරී | |
| එස්.එස්.පී. ද සිල්වා මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ආයතනික සේවා හා පරිපාලන අංශය |
| එච්.ජී.එල්. වික්‍රමසිංහ මයා | සහකාර අධිකාරී | |
| කේ.ජී.එන්. විජේරත්න මිය | සහකාර අධිකාරී | |
| එම්.එන්. වීරසිංහ මයා | සහකාර අධිකාරී | |
| පී.ඩබ්. විමල් ශාන්ත මයා | සහකාර අධිකාරී | රැස්කිරීම් අංශය |
| සුනිල් කොස්වත්තගේ මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ජංගම දායක මුදල් අංශය |
| කේ.ඒ.එන්.එල්. රත්නසේකර මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| පී.බී.එන්.ඒ. සමරනායක මිය | සහකාර අධිකාරී | |
| කේ.ඒ. සේනාරත්න මිය | සහකාර අධිකාරී | |

| | | |
|---|---|---|
| බී.එම්.ඩබ්.එස්. බාලසූරිය මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | නැවත ලියාපදිංචි කිරීමේ අංශය |
| වයි.සී.එම්. විජේතිලක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| කේ.ජී. තිලකසිරි මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ගිණුම්ගත දායක මුදල් අංශය |
| යූ.ජී. ගුණවර්ධන මයා | සහකාර අධිකාරී | |
| එම්.ජී.ඩී.එල්. සිරිල් මයා | සහකාර අධිකාරී | |
| ඩී.එම්.ජී. පියතිලක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | විද්‍යුත් මාධ්‍යයෙන් දායක මුදල් ගිණුම්ගත කිරීමේ අංශය |
| කේ.එම්.ටී.ජී.වයි. බණ්ඩාර මිය | කළමනාකරණ පුහුණු | |
| එන්.එල්.එම්. අබේසේකර මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | අරමුදල් කළමනාකරණ අංශය |
| ටී. උදයසීලන් මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඩී.එල්. රෝහිනී මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඩබ්.ජී.ආර්. හර්ෂප්‍රිය මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඩී.පී. උඩුගමකෝරාල මිය | සහකාර අධිකාරී | |
| එස්.පද්මනාපන් මයා | සහකාර අධිකාරී | |
| කේ.එල්.ජී.සී.එන්. අනුරාධ මයා | සහකාර අධිකාරී | |
| ජී.ජී.ආර්. ලාන්සන් මයා | කළමනාකරණ පුහුණු | |
| එච්.ජී. හෙට්ටිහේවා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ගිණුම් සහ පියවීම් අංශය |
| ජී.බී.එම්.පී. දිසානායක මිය | සහකාර අධිකාරී | |
| ඊ.ටී.ඩබ්.ටී.ආර්.පී. උඩකුඹුර මිය | කළමනාකරණ පුහුණු | |
| ඩී.වයි.එස්. මහගෙදරවත්ත මිය | සහකාර අධිකාරී | වාර්තා කළමනාකරණ අංශය |
| ජී.ටී. උපසේන මයා | සහකාර අධිකාරී | |
| කේ.එම්.සී. සෝමසිරි මිය | සහකාර අධිකාරී | |
| එම්. වික්‍රමරත්න මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | වාර්තා සංශෝධන අංශය |
| සී.පී. ජයවීර මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| එස්.ඩී. රත්නවීර මිය | සහකාර අධිකාරී | |
| එච්.ජී.එස්. කුලසිංහ මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | නිවාස ණය අංශය |
| එල්.එස්. ගමගේ මිය | සහකාර අධිකාරී | |
| ඩබ්.ජී. නන්දසේන මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ප්‍රතිලාභ පාලන අංශය |
| එස්.ජී. ජයවර්ධන මිය | සහකාර අධිකාරී | |
| පී.එච්.ඩී.ජී. අත්තනායක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ප්‍රතිලාභ ගෙවීම් අංශය |
| කේ.කේ.සී.එස්. කන්නන්ගර මිය | සහකාර අධිකාරී | |
| වී.කේ. දම්පහලගේ මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | මහජන සම්බන්ධතා, විමසීම් හා ඇමතුම් අංශය |

# 1. ආර්ථික සමාලෝචනය - 2013

## 1.1. ආර්ථික වර්ධනය

2013 වසරේ දී ආර්ථිකය සියයට 7.3 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා ආර්ථික කටයුතුවල ප්‍රසාරණය මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. පසුගිය වසර තුන තුළ දී සියයට 7.5 කට වඩා වැඩි වූ සවිමත් සාමාන්‍ය ආර්ථික වර්ධන වේගයක් වාර්තා කිරීමෙන් පසුව, ආර්ථික කටයුතු මධ්‍යස්ථ ලෙස වර්ධනය වීමට විදේශීය සාධක මෙන්ම දේශීය සාධක ද හේතු විය. විදේශීය අංශය සම්බන්ධයෙන් බලන කළ දුර්වල විදේශීය ඉල්ලුම හේතුවෙන් අපනයන වර්ධනය අඩු වූ අතර, 2012 වසරේ ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම අහිතකර කාලගුණික තත්ත්වයන් දේශීය ඉල්ලුම හා සැපයුම පහළ යාමට බලපෑවේය. විචක්ෂණශීලී ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති, ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ස්ථාවර මට්ටමක පැවතීම මෙන්ම දේශීය ආහාර සැපයුමේ සැලකිය යුතු දියුණුව, 2013 දී උද්ධමනාත්මක පීඩනය මර්දනය කිරීමට උපකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස අවුරුදු 5ක් පුරා අඛණ්ඩව තනි අංකයක මට්ටමේ පැවැති උද්ධමනය 2013 වසර අවසාන වන විට තනි අංක තලයේ මැද අගයක් දක්වා අනුක්‍රමයෙන් පහත වැටුණි. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට උපකාරී වීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි ජාතික සංවර්ධන වැඩ පිළිවෙලෙහි ප්‍රමුඛත්වය හිමි විය. ඊට හේතු වූයේ ඉහළ ගුණාත්මක භාවයකින් යුත් යටිතල පහසුකම් ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් කිරීම, සේවාවන් බෙදා හැරීමේ කාර්යක්ෂමතාව

රූප සටහන 9 මූර්ත ද.දේ.නි.යෙහි වාර්ෂික වර්ධනය




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

නංවාලීම, වඩාත් දියුණු වෙළඳපල ප්‍රවේශයන් තුළින් පිරිවැය අවම කිරීම සහ එමඟින් සමස්ථ ඵලදායීතාවය නඟා සිටුවීම වේ. 2013 වසරේ දී ඒකාකාරව ආර්ථික වර්ධනය ඉහළ යාමත් සමඟ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) එක්සත් ජනපද ඩොලර් (එ.ජ. ඩොලර්) 3,280 ක් දක්වා ඉහළ නැගුණි.

2013 වසරේ ස්ථිරසාර වූ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහි ඇති වූ වර්ධනය උපකාරී විය. ඉදිකිරීම් කටයුතු සහ නිෂ්පාදන යන උප අංශයන්ගේ වූ විශාල බලපෑම හේතුවෙන් කර්මාන්ත අංශයෙන් ද.දේ.නි. ට සිදුවන දායකත්වය සියයට 31.1 ක් දක්වා වැඩි කරමින් කර්මාන්ත අංශය සියයට 9.9 ක වර්ධනයක් වාර්තා කිරීමට උපකාරී විය. රජයේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් නොකඩවා ක්‍රියාත්මක වීම සහ පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතු ඉහළ යාම, ඉදිකිරීම් අංශයේ ශක්තිමත් වර්ධනයට හේතු විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන්ගේ ආර්ථිකයන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ සංචාරක අංශයෙන් වූ ඉල්ලුම ඉහළ යාම කර්මාන්ත ශාලා නිෂ්පාදන වර්ධනයට දායක විය. තොග සහ සිල්ලර වෙළෙඳ කටයුතු අඛණ්ඩව පහත වැටුණ ද ප්‍රවාහන සහ මූල්‍ය සේවා අඛණ්ඩව පුළුල් වීම හේතුවෙන් සේවා අංශය සියයට 6.4 කින් වර්ධනය විය. කෘෂිකාර්මික අංශයේ 2012 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 10.4 ක ඉහළ වර්ධනයට සාපේක්ෂව මෙම කාලසීමාව තුළ දී සියයට 4.7ක වර්ධනයක් වාර්තා කළේය. වසර ආරම්භයේ දී පැවති අහිතකර කාලගුණික තත්ත්වය දේශීය කෘෂිකාර්මික නිෂ්පාදන විශේෂයෙන්ම වී සහ අනෙකුත් ආහාර නිෂ්පාදනය පහළ යාමට බලපෑවේය.

## 1.2. උද්ධමනය හා පොලී අනුපාතය

නොකඩවා පස්වන වසරටත් උද්ධමනය තනි අංකයක මට්ටමේ පැවති අතර, 2013 වසරේ පළමු මාස දෙක තුළ අංක දෙකක මට්ටමකට ආසන්නව පැවති මතුපිට උද්ධමනය, දේශීය සැපයුම් තත්තවයන් හා වැඩි දියුණු වීම සහ

විචක්ෂණශීලී ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති හේතුවෙන් වසර අවසානය වනවිටදී ක්‍රමයෙන් මැදි තනි අංකයක් දක්වා අඩු විය. ඒ අනුව, 2013 වසර අවසානය වන විට, මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.7 ක් ද වාර්ෂික සාමාන්‍ය පදනම මත සියයට 6.9 ක්ද විය.

මේ අතර සමස්ත ඉල්ලුම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිළිබිඹු කරමින්, මූලික උද්ධමනය වසර තුළ දී ක්‍රමයෙන් අඩු වූ අතර, 2013 වසර අවසාන කාර්තුවේ දී එහි අවම අගය වාර්තා කළේය. 2013 වසර අවසානයේ දී මූලික උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.1 ක් ද වාර්ෂික සාමාන්‍ය පදනම මත සියයට 4.4 ක් ද විය. උද්ධමනය හා උද්ධමන අපේක්ෂාවන් අඩුවීම හේතුවෙන් ආර්ථිකයේ වැටුප් සඳහා වන පීඩනය අඩු වූ අතර, ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නැගුණි.

රූප සටහන 10 වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

2012 දෙසැම්බර් මාසයේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 25 කින් අඩු කිරීමෙන් ආරම්භ කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්තිය 2013 වසර තුළ දී ද අඛණ්ඩවම ක්‍රියාත්මක විය. සමස්තයක් ලෙස 2013 වසර තුළ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100 කින් තවදුරටත් අඩු කළ අතර, ද්‍රවශීලතා තත්ත්වයන් ඉහළ යාම මගින් ද ලිහිල් ප්‍රතිපත්ති ස්ථාවරය පෙන්නුම් කරන ලදී. ජූනි මස පළමු සතිය වනතෙක් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව සමීපයේ විචලනය වූ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතය 2013 මැයි මස ප්‍රතිපත්ති පොලී අනුපාත අඩු කිරීම මගින් මුදල් ප්‍රතිපත්තියේ දිශාව මහ බැංකුව විසින් තහවුරු කිරීමත් සමඟ ක්‍රමිකව ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ මධ්‍ය දෙසට විතැන් විය.

2013 ඔක්තෝබර් මාසයේ දී, ප්‍රතිපත්ති පොලී අනුපාතික පහත දැමීමත් සමග වසර තුළ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පදනම් අංක 217 කින් පහළ යමින් 2013 අවසාන වනවිට සියයට 7.66 ක් ලෙස වාර්තා විය. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතිකයට අනුකූලව එක් දින ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය ද පහළ වැටුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතික පහළ යාමේ ප්‍රවණතාවට අනුකූළ වෙමින් විවට වෙළෙඳ කටයුතු වෙන්දේසිවල බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය ද 2013 වසරේ දී පහළ ගියේය.

දැඩි ද්‍රවශීලතා තත්ත්වයේ පසු බලපෑම, 2012 පැවති දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, බැංකු අංශයේ ඇති තරගකාරීත්වය ඉහළ නංවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රබල තැන්පතු රාශිකරණය හේතුවෙන් බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය පිළිවෙලින් පදනම් අංක 64 කින් (සියයට 10.74ට) සහ පදනම් අංක 69 කින් (සියයට 13.90ට), 2013 මැයි අවසානය වන විට ඉහළ ගියේය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම සඳහා ගත් පියවර ගණනාවක් හේතුවෙන් 2013 මැද භාගය වනවිට තැන්පතු පොලී අනුපාතික පහළ වැටීම ඇරඹුණි. එහි ප්‍රතිඵලයක් ලෙස බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය 2012 අවසානයේ පැවති සියයට 10.10 සිට 2013 වසර තුළ දී සියයට 9.37 දක්වා පදනම් අංක 73 කින් පහළ ගියේය.

රූප සටහන 11 තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතික




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය 2012 අග පැවති සියයට 13.21 සිට 2013 වසර අවසානය වන විට සියයට 11.78 දක්වා පදනම් අංක 143 කින් පහළ ගියේය.

බොහෝමයක් වර්ගවල සුරැකුම්පත් සඳහා අදාළ ණය පොලී අනුපාතික වසර තුළ දී පහළ ගොස් ඇත. 2013 වසර තුළ දී රජයේ සුරැකුම්පත්, වෙළෙඳපොළ කොටස්, භාරකාර සහතිකපත් සහ කොටස්, බැඳුම්කර සහ ණයකර, ඇපයට තැබූ ණය සහ අත්තිකාරම් මත පොලී අනුපාතික 2013 වසර තුළ දී සැලකිය යුතු අන්දමින් පහළ බැස ඇත.

## 1.3.වැටුප් සහ සේවානියුක්තිය

රැකියා අපේක්ෂකයින් ශ්‍රම වෙළෙඳපොළට අලුතෙන් එකතු වීම හේතු කොටගෙන සේවා වියුක්ති අනුපාතය පෙර වසරේ පැවති සියයට 4 සිට මදක් ඉහළ ගිය ද, 2013 වසරේ දී ද එය සියයට 4.4 ක් වැනි පහළ මට්ටමක පැවතුනි. සේවානියුක්තිකයන් සංඛ්‍යාව මෙන්ම සේවා වියුක්තිකයන් සංඛ්‍යාව ද වැඩි වීම හේතුවෙන් 2013 වසරේ දී ශ්‍රම බලකාය සියයට 4.1 කින් වර්ධනය විය.

ඉදිරි දැක්මකින් යුතුව ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණයන්හි ඵලදායී බව, 2013 වසර අග භාගයේ දී වාර්තා කළ මැදි තනි අංකයක උද්ධමනය තුළින් සහ වසර තුළ දී ආර්ථික වර්ධන වේගය ඉහළ යාම තුළින් පිළිබිඹු විය. 2012 වසරේ දී අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තියේ පසු බලපෑම සහ රන් සුරැකුම් අත්තිකාරම් සැලකිය යුතු ලෙස අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය අඩු වූ අතර, 2013 වසරේ අගභාගයේ දී මුදල් සමස්තයන්ගේ ප්‍රසාරණය මන්දගාමීව අපේක්ෂිත මට්ටම දෙසට ළඟා විය. පහළ පැවති උද්ධමනය හේතුවෙන් ආර්ථික වර්ධනයට උපකාරී වීම සඳහා මහ බැංකුවට සිය මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට හැකි විය. 2012 වසරේ දී ගනු ලැබූ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මගින් අපේක්ෂිත ස්ථායීකරණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ උද්ධමන ප්‍රතිඵලයන් සහ උද්ධමන අපේක්ෂාවන් හිතකර මට්ටමක පැවතීම හේතුවෙන් වසර තුළ දී මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට මහ බැංකුවට ඉඩ සැලසුණි. වසර මුළුල්ලේම උද්ධමනය තනි අංකයක පවත්වා ගැනීම, මුදල් ප්‍රතිපත්තියේ මූලික අරමුණ විය. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 2012 වසරේ පැවති සියයට 52.6 සිට 2013 වසරේ දී සියයට 53.8 ක් දක්වා වර්ධනය වීම ප්‍රශංසනීය තත්ත්වයකි. දේශීය රැකියා අවස්ථා සඳහා ශ්‍රම වෙළෙඳපොළ වෙත ග්‍රාමීය කාන්තාවන් වැඩි වශයෙන් පිවිසීම හේතුවෙන් කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය සැලකිය යුතු ලෙස ඉහළ යාම, 2013 වසර තුළ සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය ඉහළ යාම සඳහා විශාල වශයෙන් දායක විය.

2013 වසරේ දී සියයට 5.7 කින් පෞද්ගලික අංශයේ නාමික වැටුප් වර්ධනය විය. බොහෝ උප අංශයන්හි සේවකයන්ගේ අවම වැටුප් සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ යාම මෙම වර්ධනයට හේතු විය. සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික දායකත්වයන් 2012 පැවති රු. මිලියන 2.3 සිට 2013 වසර අවසානයේ රු. මිලියන 2.4 දක්වා සැලකිය යුතු මට්ටමින් ඉහළ යාමට මෙම වැටුප් වර්ධනයන් හේතු විය.

## 1.4. මුදල් ප්‍රතිපත්තිය සහ (ෆිස්කල්) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

උද්ධමනය මධ්‍ය තනි අංකයකට අඩු වෙමින් යන මට්ටමේ පවත්වා ගනිමින් ඉදිරි දැක්මක් සහිතව ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ ඵලදායී මෙන්ම උද්ධමනය අඩු වීමට ද හේතු විය. තවද මෘදු උද්ධමන අපේක්ෂාවන්, ආර්ථික කටයුතු පුබුදුවාලීමට උපකාර වන මුදල් ප්‍රතිපත්තියට ඉඩ දුණි.

2012 වසරේ දී සංචිත මුදල් හි පැවති අඩු වර්ධන පදනමෙහි බලපෑම හේතුවෙන් සංචිත මුදල්හි වර්ධනය සියයට 16.5 ක් විය.

කෙසේ නමුත්, 2013 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම සඳහා ඉලක්කගත ආකාරයෙන් පුළුල් මුදල් සැපයුම පවත්වාගෙන යාමට අවශ්‍ය, වසරේ ඉතිරි කාලය සඳහා අපේක්ෂිත සංචිත මුදල් අඩු කිරීමට සංශෝධනයක් අවශ්‍ය වේ.

2012 වසරේ දෙසැම්බර් මස සිට මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම හා මුදල් වෙළඳපොළේ

අතිරික්ත රුපියල් ද්‍රවශීලතාවයක් පැවතීම වෙළෙඳපොළ පොලී අනුපාත අඩු වීම සඳහා පහසුකම් සැලසීය. පසු කාලීනව පහත වැටුණු දිගු කාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික, වසරේ පළමු මාස කිහිපය තුළ දී පහළ යාමේ නොනැමියාවක් පෙන්නුම් කළද කෙටි කාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික ක්ෂණිකව පහළ යන ලදී. 2013 ජූනි මස පළමු සතිය වන තෙක් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව සමීපයේ විචලනය වූ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉන් පසුව ක්‍රමිකව ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ මධ්‍යය දෙසට විතැන් විය.

සැලකිය යුතු ප්‍රමාදයක් පැවතිය ද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, රුපියල් ද්‍රවශීලතාවයේ වර්ධනය සහ අරමුදල් පිරිවැයේ අඩු වීම කෙරෙහි ප්‍රතිචාර දක්වමින් ණය පොලී අනුපාතික ද, පහළ ගියේය. ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු වීම, වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවතීම සහ උද්ධමනය හා උද්ධමන අපේක්ෂාවන් අඩු වීම පිළිබිඹු කරමින්, සෑම පරිනත කාලසීමාවක් සඳහාම රජයේ සුරැකුම්පත් මත වන ඵලදා අනුපාතික වසර මුළුල්ලේම අඩු විය.

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වාගෙන යාම සඳහා වන රජයේ අඛණ්ඩ ප්‍රයත්නය, 2013 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය සහ රාජ්‍ය ණය තවදුරටත් අඩු කිරීමට හේතු විය. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, මැදි කාලීනව ස්ථිරසාර හා ප්‍රාදේශීය වශයෙන් තුලිත සංවර්ධනයක් අත්කර ගැනීම කෙරෙහි යොමු වූ අතර, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා වූ අඛණ්ඩ පරිශ්‍රමයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශකවල ක්‍රමානුකූල වර්ධනයක් දක්නට ලැබුණි. ඒ අනුව, අයවැය හිඟය ඇස්තමේන්තුගත අයවැයෙන් සියයට 5.8 ට වඩා සුළු වැඩිවීමක් පෙන්නුම් කළද, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස එය 2012 වසරේ වාර්තා වූ සියයට 6.5 ක සිට 2013 වසරේ දී සියයට 5.9 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. ආදායමෙහි මන්දගාමී වර්ධනය හමුවේ වුවද, අත්කර ගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, රජය විසින් වියදම් කළමනාකරණය කිරීම සඳහා ගන්නා ලද ප්‍රයත්නයන්හි ප්‍රතිඵලය විය. රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.5 ක පවත්වාගත් නමුත් වර්තන වියදම් සැලකිය යුතු ලෙස පහළ යාම හා ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රමුඛතාව ලබාදීම, මැදි කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවට සමගාමීව අයවැය හිඟය අඩු කිරීම සඳහා උපකාරී විය. මේ උදෙසා රටෙහි ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය වශයෙන් සමබර කිරීම උනන්දු කරවන අතර වියදම් ක්‍රමානුකූල කිරීමට සහ ආදායම් වැඩි කිරීමට 2013 වසර තුළදී රජය නොයෙක් පියවරයන් ගන්නා ලදී.

රූප සටහන 12 රාජ්‍ය ආදායමෙහි සංයුතිය (2013)




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

බදු සහ බදු නොවන ආදායම් වල පහළ යාම හේතුවෙන් රජයේ ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ පැවති සියයට 13.9 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 13.1 දක්වා තවදුරටත් පහත වැටුණි. අනෙකුත් බදු ආදායම්වල මිශ්‍ර ප්‍රගතියක් වර්ෂය පුරා පෙන්නුම් කළද, බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා වූ සියයට 12.0 සිට සියයට 11.6 දක්වා අඩුවීමක් පෙන්නුම් කරන ලදී. මෙයට අමතරව, මැදිකාලීනව පුනරාවර්තන වියදම් තවදුරටත් තාර්කීකරණය කිරීම සඳහා වූ රජයේ කැපවීම් පෙන්නුම් කරමින් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම් අඩු විය. දේශීය වෙළෙඳපොළ තුළ සාපේක්ෂව අඩු පොලී අනුපාත පැවතීමත්, සමස්ථ දේශීය ණය ප්‍රමාණයෙහි කෙටිකාලීන ණය ප්‍රතිශතය අඩු කිරීමට පියවර ගැනීමත් හේතුවෙන් පොලී ගෙවීම් සඳහා වූ වියදම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සුළු වශයෙන් අඩු විය.

අපේක්ෂිත ආදායම් එකතුව අඩු වුවද, වියදම් තාර්කීකරණය කිරීම තුළින් රජයේ සම්පත් පරතරය අඩු කරමින් සහ රාජ්‍ය මූල්‍යන

අවශ්‍යතාවන් අවම කරමින් සමස්ත අයවැය හිඟය ඇස්තමේන්තුගත ප්‍රමාණයට ආසන්න අගයක පවත්වාගෙන යාමට හැකි විය.

2013 වසරේ රුපියල් බිලියන 516.1 ක් වූ සමස්ත අයවැය හිඟය මූල්‍යනයෙන් සියයට 76 ක් දේශීය මූලාශ්‍රයන්ගෙන් මූල්‍යනය කළ අතර, ඉතිරි සියයට 24 විදේශීය මූලාශ්‍රයන්ගෙන් මූල්‍යනය කරන ලදී. තවද, ශුද්ධ දේශීය මූල්‍යනය, මූලිකව ඇස්තමේන්තුගත රුපියල් බිලියන 359.4 සමඟ සසඳා බැලීමේ දී රුපියල් බිලියන 392.4 ක් වූ අතර, ශුද්ධ විදේශීය මූල්‍යනය මූලිකව ඇස්තමේන්තුගත රුපියල් බිලියන 148 සමඟ සසඳා බැලීමේ දී රුපියල් බිලියන 123.7 ක් විය. රජය විසින් දේශීය මූල්‍යනය මූලාශ්‍රයක් ලෙස බැංකු අංශය විශාල වශයෙන් යොදාගත් අතර 2013 වසරේ බැංකු අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය මූලිකවම ඇස්තමේන්තුගත රුපියල් බිලියන 70 ඉක්මවා යමින් රුපියල් බිලියන 297ක් වූ අතර එය 2012 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 131.5 ද ඉක්මවා යන ලදී. කෙසේ වෙතත් සමස්ත දේශීය මූල්‍යයන අවශ්‍යතාවයෙන් බැංකු නොවන අංශයේ දායකත්වය 2012 වසරේ පැවති සියයට 35 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 24 දක්වා අඩු වීමක් පෙන්නුම් කරමින් 2013 වසරේ බැංකු නොවන අංශයෙන් ලද ණය ප්‍රමාණය මූලික ඇස්තමේන්තුගත මුදල වූ රුපියල් බිලියන 289.4 ට සාපේක්ෂව රුපියල් බිලියන 95.4ට සැලකිය යුතු ලෙස අඩු විය.

සමස්ත අයවැය හිඟය අඩු කරලීම සඳහා බැංකු නොවන අංශයේ දායකත්වයේ අඩුවීමක් පෙන්නුම් කළ ද, තවමත් බැංකු නොවන අංශය සතු රාජ්‍ය ණය ප්‍රමාණයේ ප්‍රධාන ආයෝජකයා සේ.අ.අරමුදලයි. මීට හේතු වන්නේ අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා රජය 2013 වසරේ දී දීර්ඝ කාලීන වෙළෙඳපොළ ණය උපකරණ කෙරෙහි වැඩි විශ්වාසයක් දැක්වූ අතර, එහිදී වැඩි වශයෙන් දායකත්වයක් ලබා දී ඇත්තේ සේ.අ. අරමුදලයි.

## 1.5.රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ හා ප්‍රතිලාභ අනුපාතිකයන්ගේ වෙනස්වීම

2013 වසරේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි එලදා අනුපාතිකයන් ක්‍රමයෙන් අඩු වීමක් පෙන්නුම් කරන ලදී. මාස 3 පරිනත කාලයේ සිට අවුරුදු 20 පරිනත කාලයන්ට අදාළ රාජ්‍ය සුරැකුම්පත් මත (භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර) එලදා අනුපාතික පදනම් අංක 24-246 පරාසයකින් පහත වැටුණි. මාස 6 සඳහා එලදා අනුපාතිකය පදනම් අංක 347 විශාල පරාසයකින් පහළ යන ලදී. උද්ධමනය සහ උද්ධමන අපේක්ෂාවන් පහත වැටීම හේතුවෙන් මහ බැංකුව විසින් ක්‍රියාත්මක කළ ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙස එලදා අනුපාත පහත වැටුණි. තවද, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජකයින්ගේ සහභාගිත්වය වැඩි වීමත්, මෙම කාලය තුළ දී මුදල් වෙළෙඳපොළ තුල පවතින ලද අතිරික්ත ද්‍රවශීලතාවයත් නිසා එලදා අනුපාතිකය පහළ මට්ටමක පැවතීමට හේතු විය. 2013 වසර තුළ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ප්‍රාථමික වෙළෙඳපොළ එලදා වක්‍රයේ (වසර 2-30) සාමාන්‍ය බර තබන ලද එලදා අනුපාතය පදනම් අංක 500 සිට 200 දක්වා පහළ බසින ලදී.

ලිහිල් මුදල් ප්‍රතිපත්තිය සහ හිතකර උද්ධමනකාරී වාතාවරණය පිළිබිඹු කරමින් 2013 වසරේ දී රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ එලදා අනුපාතික පහළට විතැන් විය. 2013 වසරේ මුල් මාස 5 තුළ ස්ථාවරව පැවති රජයේ සුරැකුම්පත් සඳහා එලදා අනුපාතික ඉන් අනතුරුව පැහැදිලි ලෙස පහළ වැටෙනු දක්නට ලැබුණි. 2012 වසර අවසානයට සාපේක්ෂව 2013 වසර අවසානය වනවිට සියළුම පරිණත කාලයන්ට අයත් භාණ්ඩාගාර බිල්පත් මත එලදා අනුපාතික පදනම් අංක 248-343 කින් පහළ ගියේය. පසුව භාණ්ඩාගාර බැඳුම්කර මත ද්විතීයික වෙළෙඳපොළ එලදා අනුපාතික, 2012 අවසානයේ දී පැවති මට්ටම් වලට සාපේක්ෂව 2013 අග භාගයේ දී පදනම් අංක 217-288 පරාසයකින් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

රූප සටහන 13 රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ එලදාවේ සතිපතා හැසිරීම.




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

| වගුව 2 | රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| උපකරණය | | | | | | | | වාර්ෂික පොලිය සියයට |
| | ප්‍රාථමික වෙළෙඳපොළ | | | | ද්විතීයික වෙළෙඳපොළ | | | |
| | 2012 | | 2013 | | 2012 | | 2013 | |
| | අවම | උපරිම | අවම | උපරිම | අවම | උපරිම | අවම | උපරිම |
| භාණ්ඩාගාර බිල්පත් | | | | | | | | |
| දින 91 | 8.67 | 12.19 | 7.54 | 9.91 | 8.63 | 12.06 | 7.52 | 10.12 |
| දින 182 | 8.71 | 13.12 | 7.85 | 10.99 | 8.71 | 13.10 | 7.83 | 11.26 |
| දින 364 | 9.30 | 13.60 | 8.29 | 11.38 | 9.28 | 13.34 | 8.27 | 11.72 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | | | | | | |
| අවුරුදු 2 | 9.45 | 13.62 | - | - | 9.37 | 13.77 | 8.53 | 11.65 |
| අවුරුදු 3 | 10.20 | 13.50 | 10.87 | 10.98 | 9.58 | 13.93 | 9.05 | 11.75 |
| අවුරුදු 4 | 9.55 | 14.10 | - | - | 9.69 | 14.16 | 9.54 | 11.95 |
| අවුරුදු 5 | 10.75 | 14.15 | 10.64 | 11.17 | 9.78 | 14.35 | 10.26 | 12.01 |
| අවුරුදු 6 | 9.75 | 14.25 | 10.97 | | 9.81 | 14.36 | 10.37 | 11.99 |
| අවුරුදු 10 | 10.25 | 14.75 | 11.76 | 11.80 | 9.93 | 14.63 | 10.88 | 12.30 |
| අවුරුදු 15 | - | - | 11.90 | 12.21 | 10.07 | 14.59 | 11.14 | 12.72 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 2. සේ.අ.අ. ප්‍රගති සමාලෝචනය

2013 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රුපියල් ට්‍රිලියන 1.3 ක් වූ අතර, මෙය 2012 වසරේ රුපියල් ට්‍රිලියන 1.1 හා සැසඳීමේ දී සියයට 13.6 ක වර්ධනයකි. 2013 වසර අවසන් වනවිට මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 15 ක් විය. එය 2012 වසර අවසානයේ වූ මිලියන 14.6 හා සසඳන විට සියයට 2.7 ක වර්ධනයකි. සක්‍රිය සාමාජික ගිණුම් ප්‍රමාණය 2012 වසර අග වූ මිලියන 2.3 සිට 2013 වසර අග වන විට දී මිලියන 2.4 දක්වා වර්ධනයක් වාර්තා කළ අතර, අක්‍රිය සාමාජික ගිණුම් සංඛ්‍යාව 2012 වසර අග මිලියන 12.3 ට සාපේක්ෂව මිලියන 12.8 දක්වා 2013 වසර අග දී වර්ධනය විය. එමෙන්ම සක්‍රීය සේවායෝජකයින් සංඛ්‍යාව 2012 වසර අවසානයේ වූ 68,140 ට සාපේක්ෂව, 2013 වසර අවසානයේ දී 70,392 දක්වා සියයට 3.3 කින් වර්ධනය විය.

### 2.1. සාමාජික දායකත්ව හා අරමුදල් ප්‍රතිලාභ ගෙවීම්

2013 වසරේ දායක මුදල් 2012 දී පැවති රු. බිලියන 70.2 සිට රු. බිලියන 80.5 දක්වා සියයට 14.7 කින් වර්ධනය විය. රු. බිලියන 50.2 ක් 2013 වසරේ දී සාමාජිකයන්ට හා ඔවුන්ගේ උරුමකරුවන්ට ගෙවූ අතර, එය 2012 වසරේ ගෙවූ රු. බිලියන 48.7 ට සාපේක්ෂව සියයට 3 ක වර්ධනයකි. ඒ අනුව ශුද්ධ දායක මුදල් (දළ දායක මුදලින් ප්‍රතිලාභ අඩු කළ පසු) පෙර වසරේ වූ රු. බිලියන 21.5 සිට රු. බිලියන 30.3 දක්වා සියයට 40.9කින් වර්ධනය විය.

රූප සටහන 14 — දායක මුදල්, ප්‍රතිලාභ හා ශුද්ධ දායක මුදල්




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| දායක මුදල් (රු. බිලියන) | 48.7 | 54.8 | 61.9 | 70.2 | 80.5 |
| ප්‍රතිලාභ (රු. බිලියන) | 31.9 | 34.9 | 47.3 | 48.7 | 50.2 |
| ශුද්ධ දායක මුදල් (රු. බිලියන) | 16.8 | 19.9 | 14.6 | 21.5 | 30.2 |

මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

පසුගිය වසර 5 තුළ, දායක මුදල්, ප්‍රතිලාභ ගෙවීම්වලට සාපේක්ෂව වැඩි වේගයකින් වර්ධනය වූ නිසා ශුද්ධ දායක මුදල්වල වැඩිවීමක් පෙන්නුම් කරන ලදී (රූප සටහන 14). ගෙවූ ප්‍රතිලාභවලින් වැඩි කොටසක් විශ්‍රාමික දිවියට එළඹි සාමාජිකයන් සඳහා වූ අතර, දෙවැනි වැඩිම ප්‍රතිලාභ ගෙවීම් සිදු වී ඇත්තේ විවාහය නිසා රැකියාවෙන් ඉවත් වූ සාමාජිකාවන් සඳහාය.

වගුව 3 — සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් - 2013

| ප්‍රතිලාභ ගෙවීම් සඳහා ඉවහල් වූ හේතුව | ප්‍රතිලාභ ගෙවීම් ඉල්ලුම්පත් ගණන | | ප්‍රතිලාභ ගෙවීම් වල මුළු එකතුව (අ) | |
|---|---|---|---|---|
| | ගණන | % | අගය (රු.බි.) | % |
| විශ්‍රාමික දිවියට එළඹීම | 73,596 | 64.5 | 38.53 | 77.0 |
| විවාහ හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම | 24,614 | 21.6 | 4.84 | 9.7 |
| සංක්‍රමණය | 1,739 | 1.5 | 2.24 | 4.5 |
| වෛද්‍ය හේතූන් | 1,017 | 0.9 | 0.55 | 1.1 |
| සාමාජිකයාගේ මරණය | 5,392 | 4.7 | 2.31 | 4.6 |
| විශ්‍රාම වැටුප් ලැබෙන රැකියාවකට සම්බන්ධ වීම | 7,734 | 6.8 | 1.55 | 3.1 |
| වෙනත් | 22 | 0.0 | 0.02 | 0.0 |
| **එකතුව** | **114,114** | **100.0** | **50.04** | **100.0** |

(අ) මෙහි අන්තර්ගත වනුයේ කොටස් ගෙවීම්, හිමිකම් නොපෑ ප්‍රතිලාභ හා රඳවා ගනු ලැබූ ප්‍රතිලාභ හැර පළමු ප්‍රතිලාභ ගෙවීම පමණි.

මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.2. සේ.අ. ආයෝජන කළඹ

රූප සටහන 15 — ආයෝජන කළඹෙහි සංයුතිය 2008 - 2013




මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2013 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම රු. බිලියන 1,257.3 (පොත් අගය) ලෙස වාර්තා වූ අතර, එය 2012 වසරේ පැවති රු. බිලියන 1,105.5 ට සාපේක්ෂව සියයට 13.7 ක වර්ධනයකි (රූප සටහන 15). මෙම ආයෝජන වර්ධනයට ප්‍රධාන ලෙස හේතු වූයේ ආයෝජන මත ප්‍රතිලාභය හා සාමාජික දායක මුදල් වල වූ වර්ධනයයි.

රාජ්‍ය සුරැකුම්පත් හි ආයෝජන මත සංකේන්ද්‍රණය 2012 දී සියයට 93.6 ක් වූ අතර, එය 2013 වසර අග වන විට දී සියයට 92.5 දක්වා පහළ වැටුණි. එසේ නමුත් ව්‍යාපාර කොටස්වල ආයෝජන 2012 දී වූ සියයට 5.4 සිට 5.8 දක්වා වර්ධනය වූ අතර, සාංගමික ණයකර මත සියයට 1.2 ක් ආයෝජනය කළ අතර, ඉතිරි සියයට 0.5 අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම සඳහා ප්‍රතිවිකිණීමේ ගිවිසුම් (Reverse Repo) වැනි ඉහළ ද්‍රවශීලතාවයක් සහිත වත්කම්වල ආයෝජනය කර තිබුණි.

### 2.2.1. රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹ

භාණ්ඩාගාර බැඳුම්කර, රුපියල් ණය හා භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹ 2012 දී පැවති රු. බිලියන 1,035.2 සිට 2013 දී රු. බිලියන 1,163.6 දක්වා සියයට 12.4 කින් වර්ධනය විය. 2013 වසර අවසානයේ දී භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය මුළු ආයෝජන කළඹෙන් සියයට 89.6 ක් විය. වසර තුළ දී, රජයේ රුපියල් ණයවල පැවති ආයෝජන සියයට 2.1 සිට සියයට 1.8 දක්වා ඉතා සුළු ප්‍රමාණයකින් අඩු විය. මෙයට හේතු වූයේ භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය ඉහළ යාම සහ රුපියල් ණයවල ශුද්ධ ආයෝජනය ශුන්‍ය වීමය.

2013 වසරේ දී සේ.අ.අ. රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹෙන් පොලී ආදායම්, ක්‍රමක්ෂය ලාභ සහ ප්‍රාග්ධන ලාභ ලෙස රු.බිලියන 133.0ක ආදායමක් උපයා ගන්නා ලදී. මෙය අරමුදලේ මුළු දළ ආදායමෙන් සියයට 97.3 ක අගයක් විය. 2013 වසරේ දී, රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹෙහි උපලබ්ධි ප්‍රතිලාභ අනුපාතය සියයට 12.1ක් වූ අතර, රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹෙහි බරිත සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතිකය

වගුව 4 — රාජ්‍ය සුරැකුම්පත් කළඹේ කල්පිරීම් ආකෘතිය - 2013 අවසානයේ දී

| ආයෝජන වර්ගය | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ප්‍රතිලාභය (%) |
|---|---|---|---|
| | 2013 | 2013 | 2013 |
| වසරකට වඩා අඩු | 139.5 | 10.0 | 9.8 |
| වසර 1-2 | 195.7 | 14.1 | 9.8 |
| වසර 3-4 | 216.2 | 15.5 | 10.8 |
| වසර 5 ට වැඩි | 842.0 | 60.4 | 11.9 |
| **එකතුව** | **1,393.4** | **100.0** | **11.2** |

මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2013 අවසානයේ දී සියයට 11.2 ක් විය. මුළු රාජ්‍ය සුරැකුම්පත් කළඹෙන් සියයට 39.6 ක් මීළඟ වසර 5 තුළ කල්පිරීමට නියමිත අතර, ඉතිරි සියයට 60.4 ක ප්‍රතිශතය ඉන් වසර 5කට පසු කල්පිරීමට නියමිතය (වගුව 4).

### 2.2.2. සමාගම් කොටස් කළඹ

රූප සටහන 16 — කොටස් ආයෝජන කළඹේ ආංශික සංයුතිය - 2013 වසර අවසානයට




මූලාශ්‍රය : සේ.අ.අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සමාගම් කොටස් කළඹ, ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් අඩංගු වේ. ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස්වල කළ නව ආයෝජන හා සේ.අ.අ. දැනටමත් ආයෝජනය කර ඇති ආයතනයන්හි ආයෝජනයන්හි වර්ධනයන් නිසා 2012 වසරේ වූ ආයෝජන කළඹ රු.බිලියන 59.2 සිට 2013 වසරේ දී රු. බිලියන 72.8 දක්වා රු.බිලියන 13.6 කින් (සියයට 22.9 කින්) වැඩි විය. සමාගම් කොටස් කළඹ, 2013 වසර අවසානයේ දී රු. බිලියන 72.3 ක කොටස් ආයෝජන කළඹකින් ද රු. බිලියන 0.5 ක වෙළෙඳ කළඹකින් ද සමන්විත විය.

සේ.අ.අ. කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත බැංකු හා මූල්‍ය, හෝටල් සහ සංචාරක, විවිධාංගීකරණ, නිෂ්පාදන, ඉදිකිරීම් සහ ඉංජිනේරු, විදුලිබල සහ බලශක්ති සහ විදුලි සංදේශ යන අංශයන්හි ප්‍රධාන වශයෙන් ස්ථාවර වූ සමාගම් ඇතුලත්ව මනා ලෙස විවිධාංගීකරණය කරන ලද විකිණීම සඳහා

වගුව 5 — ආයෝජන ආදායම

| ආදායම් මූලාශ්‍රය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.මි.) | ප්‍රතිශතය (%) | වටිනාකම (රු.මි.) | ප්‍රතිශතය (%) |
| පොලිය හා ක්‍රමක්ෂය ලැබීම් | 118,696 | 97.8 | 131,994 | 96.8 |
| රජයේ සුරැකුම්පත් මගින් ලැබූ ප්‍රාග්ධන ලාභ | 34 | - | 1,016 | 0.7 |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලැබූ ලාභ/අලාභ | (388) | (0.3) | (45) | - |
| සමාගම් කොටස් මගින් ලැබූ ප්‍රාග්ධන ලාභ | 1,020 | 0.8 | 112 | 0.1 |
| ලාභාංශ | 1,996 | 1.7 | 3,226 | 2.4 |
| **මුළු එකතුව** | **121,358** | **100.0** | **136,303** | **100.0** |

මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

තබාගෙන ඇති ආයෝජන කළඹ මෙම වසර තුළ දී ද අරමුදල විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබීය. (රූප සටහන 16).

ලාභාංශ, ප්‍රාග්ධන ලාභ සහ වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලැබූ ලාභ/අලාභ මගින් ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට වූ සමාගම් කොටස් ආයෝජන කළඹ 2013 වසරේ දී වූ රු.බිලියන 3.3 ක ආදායමක් උපයනු ලැබීය. එය 2012 වසරේ උපයා ගත් රු. බිලියන 2.6 ට සාපේක්ෂව සියයට 26.9 ක වර්ධනයක් සටහන් කරන ලදී.

### 2.2.3. සාංගමික ණය කළඹ

සේ.අ.අ. සාංගමික ණයකර, භාර සහතික, උකස් සුරැකුම් ආදී ඉහළ ණය ශ්‍රේණියක් සහිත සාංගමික ණය උපකරණයන්හි ආයෝජනය කර ඇත. 2013 වසරේ දී අරමුදල, වෙළෙඳපොළ ලැයිස්තුගත ණය නිකුත් කිරීම් 10 ක ආයෝජනය කරන ලදී. සාංගමික ණය කළඹ 2013 දෙසැම්බර් 31 දින වනවිට අරමුදලෙන් රු.බිලියන 14.3 ක් වූ අතර, එය මුළු අරමුදලෙන් සියයට 1.1 ක් විය. අරමුදල රු. මිලියන 1,256 ක පොලී ආදායමක් සාංගමික ණය කළඹෙන් ඉපැයූ අතර, කළඹෙහි සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය වසරකට සියයට 11.22 ක් විය.

ලබයි. 2013 වසරේ දී අරමුදල රු. මිලියන 389 ක පොලී ආදායමක් ප්‍රති විකුණුම් මගින් උපයා ගන්නා ලදී.

### 2.2.5. අරමුදලේ ආදායම

අරමුදල රු. බිලියන 136.3 ක ආදායමක් 2013 වසරේ දී උපයා ගත් අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 12.6 ක ඉහළයාමකි (වගුව 5). පොලී ආදායම්, අරමුදලේ ප්‍රධානතම ආදායම විය (මුළු ආදායමෙන් සියයට 76.9). පොලී ආදායම් 2012 වසරේ වූ රු. බිලියන 90.9 සිට 2013 වසරේ දී රු. බිලියන 105.0 ක් වූයේ සියයට 15.5 ක වර්ධනයක් සහිතවය. තවද, සමාගම් කොටස් මගින් ලැබුණු ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ සියයට 10.7 කින් වර්ධනය වූයේ 2012 වසරේ වූ රු.මිලියන 3,016 සිට 2013 වසරේ දී රු. මිලියන 3,338 ක් දක්වා වර්ධනය වෙමිනි. කෙසේවුවත්, භාණ්ඩාගාර බැඳුම්කර මගින් ලැබූ ක්‍රමක්ෂය ලාභ 2012 වූ රු. බිලියන 27.8 ට සාපේක්ෂව සියයට 3 කින් පහත වැටුණු අතර එය 2013 දී රු. බිලියන 26.9 ක් වූයේ අධි එලදා සහිත බැඳුම්කරයන්හි (premium bonds) ආයෝජනයෙන් සහ ආයෝජන කළඹෙහි සාමාන්‍ය කල්පිරීම් කාලය ඉහළ ගිය නිසාය.

### 2.3. මෙහෙයුම් වියදම්

**වගුව 6 — මෙහෙයුම් වියදම්**

| අයිතමය | මුදල් මණ්ඩලය | | | කම්කරු දෙපාර්තමේන්තුව | | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | වෙනස | 2012 | 2013 | වෙනස |
| | (රු.මි) | (රු.මි) | (%) | (රු.මි) | (රු.මි) | (%) |
| සේවක වියදම් | 288 | 334 | 15.97 | 226 | 235 | 3.98 |
| පරිපාලන වියදම් | 224 | 237 | 5.80 | 172 | 127 | (26.16) |
| වෙනත් වියදම් | 25 | 33 | 32.00 | 12 | 12 | - |
| **එකතුව** | 537 | 604 | 12.48 | 410 | 374 | (8.78) |
| **මුළු වියදම්, දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.44** | **0.44** | | **0.34** | **0.27** | |

මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### 2.2.4. ප්‍රතිවිකුණුම් ගනුදෙනු (Reverse Repurchase Transactions)

අරමුදලේ ද්‍රවශීලතාව කළමනාකරණය සඳහා දෛනික අතිරේක අරමුදල් ප්‍රතිමිලදී ගැනීම් හා විකිණීම් වෙළෙඳපොළේ ආයෝජනය කරනු

ප්‍රධාන වශයෙන් සේවක වියදම්වල ඉහළයාම නිසා 2012 වසරේ දී වූ රු. මිලියන 947.7 ක් වූ මෙහෙයුම් වියදම් 2013 වසරේ දී රු. මිලියන 978.9 ක් දක්වා සියයට 3.29 කින් වර්ධනය විය. කෙසේ වෙතත් වසර තුලදී මුළු මෙහෙයුම් වියදම් මුළු දළ ආදායමට සාපේක්ෂව සියයට

0.7 ක් දක්වා අඩු කිරීමට අරමුදල සමත්විය. පෞද්ගලික අරමුදල් කළමනාකරුවන් සියයට 1 සිට සියයට 2 දක්වා වූ කළමනාකරණ ගාස්තු අයකරන වටපිටාවක, දළ ආදායමෙන් සියයට 1 ට අඩු මට්ටමක මෙහෙයුම් වියදම් පවත්වාගෙන යාම සුවිශේෂී ජයග්‍රහණයකි.

## 2.4. බදු වියදම්

2013 වසරේ දී, සේ.අ.අ. රු. මිලියන 10,068 ක් ආදායම් බදු ලෙස ගෙවා ඇත. 2012 වසරේ ගෙවූ රු.මිලියන 8,636 ට සාපේක්ෂව මෙය සියයට 16.5 ක වර්ධනයකි.

## 2.5. සාමාජික ගිණුම් ශේෂ හා ගෙවූ පොලිය

2013 වසරේ දී සියළු සාමාජික ගිණුම් ශේෂයන් 2012 වසරට සාපේක්ෂව සියයට 13.9 ක අගයකින් ඉහළ දමමින් රු. බිලියන 126.9 ක මුදලක් සාමාජිකයන් අතර පොලී ලෙස බෙදා දුන් අතර, සාමාජික ගිණුම් ශේෂ 2012 වසරේ පැවති රු. බිලියන 1,124ට සාපේක්ෂව 2013 වසරේ දී රු. බිලියන 1,281 ක් දක්වා වර්ධනය විය. පොලී අනුපාත පහළ යෑමේ පරිසරයක් තුළ වුවද සියයට 11.0 ක් වැනි පොලී අනුපාතිකයක් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ ප්‍රකාශ කිරීමට අරමුදලට හැකි විය.

රූප සටහන 17 සාමාජික ශේෂ සහ ගෙවූ පොලිය




මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.6. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාමික අරමුදල ලෙස සේ.අ.අ. එහි ආරක්ෂාව සහ වර්ධනය සුරක්ෂිත කරන අතරතුර අර්ධ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවානියුක්තිකයන්ට උපරිම විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීම සඳහා ඔවුන්ගේ දිගුකාලීන ඉතිරිකිරීම් සේ.අ.අ. විසින් කළමනාකරණය කරනු ලැබේ. සේ.අ.අ. මූල්‍ය ක්ෂේත්‍රයේ ඉතා වැදගත් ආයතනයක් වන්නේ 2013 දෙසැම්බර් 31 දින වනවිට එය මූල්‍ය ක්ෂේත්‍රයේ මුළු වත්කම්වලින් සියයට 12.6 ක් පමණ නියෝජනය කිරීම නිසයි. එම නිසා මූල්‍ය මණ්ඩලය අරමුදල සම්බන්ධ අවදානම් කළමනාකරණය පිළිබඳව විශාල අවධානයක් ලබාදෙනුයේ අරමුදලේ සුරක්ෂිතභාවය තුලින් රටෙහි මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමටය. අරමුදල මගින් මුහුණදෙන ප්‍රධාන අවදානම් ලෙස ණය අවදානම, වෙළෙඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මෙහෙයුම් අවදානම හැඳින්විය හැකිය.

### 2.6.1. ණය අවදානම

ණය අවදානම යනු නියමිත කාලවකවානුවේ දී අනෙක් පාර්ශවය හෝ නිකුත්කරන්නා විසින් පොලී ගෙවීම හා ප්‍රාග්ධනය ගෙවීම යන මූල්‍ය බැඳීම් බේරුම් කිරීමට නොහැකි වීම මගින් ඇති විය හැකි අලාභයයි. මුළු ආයෝජිත ප්‍රමාණයෙන් සියයට 92.5 ක්ම රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති බැවින් සේ.අ.අ. වෙත ඇති ණය අවදානම් ඉතා අවම වේ. අරමුදලින් සියයට 1.5 ක ආයෝජනය කර ඇති සාංගමික ණයකර වලින් ඇති වන්නා වූ ණය අවදානම ඉතා අඩු මට්ටමක පවතින්නේ අරමුදල ඉහළ ණය සුදුසුකමක් ඇති සාංගමික ණය උපකරණවල පමණක් ආයෝජනය කරන නිසාවෙනි. එවැනි ආයෝජන සිදු කරනු ලබන්නේ එහි අවදානම හා ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් සම්පූර්ණ විශ්ලේෂණයක් සිදු කිරීමෙන් අනතුරුවයි. මීට අමතරව, අරමුදලේ සියයට 0.5 ක් පමණ වන සියලුම ප්‍රතිවිකුණුම් ආයෝජන සඳහා ඇප වශයෙන් ප්‍රමාණවත් පරිදි රාජ්‍ය සුරැකුම්පත් තබා ගෙන ඇති නිසා සේ.අ.අ. ණය අවදානම ඉතාමත් අඩු මට්ටමක පවතී.

### 2.6.2. වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානම යනු පොලී අනුපාතිකයන්ගේ, සමාගම් කොටස් හා විනිමය අනුපාතික යන වෙළෙඳපොළ මිල ගණන්වල සිදුවන වෙනස්කම් වලින් පැනනගින අවදානමයි. දැනට, අරමුදල මගින් මුහුණදෙන වෙළෙඳපොළ අවදානම කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එය කෙසේද යත් පොලී අනුපාතික මගින් ඇතිවන අවදානම සහ

කොටස් මිල අවදානම ලෙසයි. වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යනවිට අලෙවිය සඳහා ඇති භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙහි වටිනාකම් ක්‍රමයෙන් අඩු වන අතර, පොලී අනුපාතික පහළ යාමේ දී අරමුදලට අඩු පොලී අනුපාතිකයන් හි ආයෝජනය කිරීමට සිදු වෙයි. කෙසේ වෙතත් විවිධ කල්පිරීම් හා විවිධ ප්‍රතිලාභ සහිත භාණ්ඩාගාර බැඳුම්කර තෝරා ගැනීමෙන් හා වෙළෙඳ කළඹේ විශාලත්වය සීමා කිරීම මගින් මෙම අවදානම කාලානුරූපව කළමනාකරණය කර ගෙන තිබේ.

අරමුදල විසින් මුහුණපානු ලබන සමාගම් කොටස්වල අවදානම වනුයේ කොටස් මිල ගණන් පහළ යාම නිසා කොටස් ආයෝජන කළඹෙහි අගය අඩු වීමයි. කොටස් ආයෝජන කළඹෙහි ඉහළ සීමාවන් ස්ථාපනයෙන් සහ බැංකු, මූල්‍ය සහ රක්ෂණ, විවිධාංගීකරණ සමාගම්, හෝටල් සහ ප්‍රවාහන, ඉදිකිරීම් සහ ඉංජිනේරු, නිෂ්පාදන සහ විදුලි සංදේශ යන විවිධ අංශයන්හි සෑම සාධකයක්ම සැලකිලිමත් ලෙස විශ්ලේෂණය කිරීමෙන් පසු ආයෝජන කළඹ විවිධාංගීකරණය කරමින් ආයෝජන සිදු කිරීමෙන් මෙම අවදානම අවම කර ගනු ලැබේ. තවද, අරමුදලේ සමස්ථ ආයෝජන කළඹෙන් කොටස් ආායෝජන කළඹ සියයට 5.8 ක් පමණ වන බැවින් වෙළෙඳපොළ අවදානම සාපේක්ෂව පහළ අගයක් ගනී.

### 2.6.3. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මූල්‍ය බැඳීම් ඒවා ගෙවිය යුතු දිනට ගෙවීමට නොහැකි වීම තුලින් ඇතිවන අවදානමයි. අරමුදලේ ශුද්ධ දායක මුදල් (ආසන්න වශයෙන් රු.බිලියන 2.3) සෑම මසකම ධන අගයක් වීම මගින් ද්‍රවශීලතා අවදානම අවම වී තිබේ. 2013 වසර අවසානය වනවිට ආදායම්, කල්පිරීම් උත්පාදන හා වාර්ෂික ප්‍රතිලාභ ගෙවීම් ආදී මුදල්, මුළු මුදල් ප්‍රවාහ ගලා ඒම් වල ප්‍රතිශතයක් ලෙස සියයට 5.9 කි. මීට අමතරව ඉහළ ද්‍රවශීලතාවයක් ඇති රාජ්‍ය සුරැකුම්පත් මගින් කවර හෝ ආකාරයක ද්‍රවශීලී බාධකයන්ට එරෙහිව අමතර සුරක්ෂිතතාවක් ලබා දෙයි. දෛනික ද්‍රවශීලී කළමනාකරණ මෙවලමක් ලෙස සේ.අ.අ. එක්දින ප්‍රති මිලදී ගැනීම් (over night Repo) හි ආයෝජනය කරන්නේ දෛනිකව ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යමින් සාධාරණ ප්‍රතිලාභ ඉපැයීමටය. එම නිසා අරමුදලේ ද්‍රවශීලී අවදානම ද ඉතා අවම වෙයි.

### 2.6.4. මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු, ප්‍රමාණවත් නොවූ හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, මානව හා පද්ධති හෝ බාහිර සිදුවීම් (නෛතික අවදානම් ද ඇතුළුව) මගින් ඇතිවන සත්‍ය අලාභය, අපේක්ෂිත අලාභයෙන් වෙනස් වීම මගින් ඇතිවෙන අවදානමයි. තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම්, මානුෂීය දෝෂ හා මැදිහත්වීම් නිසා ඇතිවන අවදානම සහ ස්වභාවික විපත් ආදිය අරමුදලේ මෙහෙයුම් අවදානම ඇති වීමට බලපාන ප්‍රධාන මූලාශ්‍ර වේ. මෙම අවදානම් අඩු කර ගැනීම සඳහා අරමුදල ඉතා සුපරික්ෂාකාරී මෙහෙයුම් අවදානම් කළමනාකරණ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවා ඇත. මෙහෙයුම් කටයුතු ස්වාධීන අභ්‍යන්තර විගණක මගින් විගණනය කරන අතර, අඩුපාඩු නිවැරදි කර ගැනීම හා විචලනයන් ඉක්මනින් සොයා ගැනීම සඳහා විගණන සොයා ගැනීම් මාසිකව සාකච්ඡා කරනු ලබයි. තවදුරටත්, සේ.අ.අරමුදලේ දත්ත මංගත තත්කාලීන උපස්ථ පද්ධතියක් (online real time backup system) පවත්වාගෙන යනු ලබන AS 400 පරිගණක පද්ධතිය මගින් අරමුදලට තම කටයුතු කිසිදු කරදරයකින් තොරව සිදු කර ගැනීමට හැකි වී තිබේ. මීට අමතරව, අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් මෙහෙයුම් ක්‍රියා පටිපාටියේ ඇන හිටීම වැලැක්වීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් (BCP) සහ ආපදා ප්‍රතිසාධන භූමිය (DRS) පරීක්ෂණයට ලක් කිරීම සෑම වසරකදීම සිදු කරනු ලැබේ.

ගනුදෙනු සඳහා වූ බලතල මට්ටම්, මෙහෙයුම් අත්පොත් පවත්වාගෙන යාම, මුරපද යොදා ගැනීමෙන් තොරතුරු වලට ප්‍රවේශය සීමා කිරීම, වෙනම අවදානම් කළමනාකරණ ඒකකයක් පවත්වාගෙන යාම හා මෙහෙයුම් අවදානම් ලේඛනය යන වෙනත් යාන්ත්‍රණ යොදා ගැනීම මගින් මෙහෙයුම් අවදානම් අඩු කරගෙන ඇත.

## 2.7. නිවාස ණය පහසුකම

සාමාජිකයන්ට නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව හා සමූපකාර

| වගුව 7 | නිවාස ණය පහසුකම | | |
|---|---|---|---|
| වසර | නිකුත් කළ සහතිකපත් (ගණන) | සේ.අ.අ. මගින් සහතික කරන ලද ණය (රු.මි.) | ණය නිකුත් කරන ආයතන වලට ගෙවූ මුදල (රු.මි.) |
| 2004 | 14,307 | 2,452 | 735 |
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| එකතුව | **141,305** | **38,581** | **14,883** |

මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ග්‍රාමීය බැංකු යනාදී සහභාගීත්ව ණය දෙන ආයතනවලින් නිවාස ණයක් ලබා ගැනීමේ අරමුණින් 1988 දී ඉදිරිපත් කරන ලද නිවාස ණය ක්‍රමය 2013 වසරේ දී ද පෙර පරිදිම ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය යටතේ, සේ.අ.අ. සාමාජික ශේෂය මත වගකීම් සහතිකපත් නිකුත් කිරීම එලෙසම සිදු කරන ලදී. මෙම වසර තුළ දී රු. මිලියන 6,914 ක්වූ නිවාස ණය සඳහා අනුමැතිය ලබා ගැනීමට සාමාජික ශේෂ සහතිකපත් 16,268 ක් ණය ලබාදෙන ආයතන වෙත නිකුත් කරන ලදී (වගුව 7). තවද, 2013 දී, 2012 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රු. මිලියන 2,178 කට ආසන්න මුදලක් අදාළ සාමාජික ගිණුම්වලින් අඩු කොට, අදාළ ණය දෙන ආයතනවලට ප්‍රේෂණය කරන ලදී.

## 2.8. නීතිය ක්‍රියාවට නැංවීම

සේ.අ.අ පනතට අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට අරමුදලේ සාමාන්‍ය පරිපාලනයේ වගකීම හා නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව, 2013 වසරේ දී දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කාර්යාල විසින් සේවායෝජකයන් 6,822 දෙනෙක් හා සේවානියුක්තිකයන් 448,398 දෙනෙක්, සියලු පළාත් ආවරණය කරමින්, ලියාපදිංචි කර ඇත. 2013 වසරේ ලියාපදිංචි වූ සේවායෝජකයන්ගෙන් සියයට 46 කට වැඩි සේවායෝජකයන් පිරිසක් බස්නාහිර පළාතට අයත් වූ අතර, උතුරු සහ නැගෙනහිර පළාත් වලින් ලියාපදිංචි වූ මුළු සේවායෝජකයන් ගණන සියයට 10 ක් විය.

පනතේ විධිවිධානවලට අනුකූලව, සේවක දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට බලය ලබා දී ඇත. ඒ අනුව, මේ වනවිට දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල විසින් පිළිවෙලින් රුපියල් මිලියන 5,100 ක් හා රුපියල් මිලියන 6,132 ක් පියවා ගැනීම සඳහා මුල් නිවේදන 12,807 ක් ද, රතු නිවේදන 8,411 ක් ද යවා ඇත. තවද, ගෙවීම් පැහැර හරින ලද ආයතනවලින් රතු නිවේදන ලබා දින 28 ක් ඇතුළත හිඟ මුදල් ආපසු ගෙවීමට අපොහොසත් වූ ආයතන 2,744 කට එරෙහිව නඩු පවරා රුපියල් මිලියන 2,442 ක් අයකර ගෙන ඇත.

## 2.9. සේ.අ.අ. සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම

සාමාජිකයන්ට කාර්යක්ෂම සේවයක් ලබාදීමේ අරමුණින් 2008 දී ඇරඹි සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වී සිදු කළ ප්‍රධාන ව්‍යාපෘති අතරින් එකකි. එහිදී සේ.අ.අ. සාමාජිකයන්, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි නම සඳහන්ව ඇති ආකාරයට, නැවත ලියාපදිංචි කරන අතර, ජාතික හැඳුනුම්පත් අංකය, සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය (UID) ලෙස භාවිතා කිරීම සිදු කරනු ඇත. එයින්, සේ.අ.අ. දත්ත ගබඩාව සාමාජිකයන් කේන්ද්‍ර කරගත් දත්ත ගබඩාවක් ලෙස භාවිතා කිරීමට දෙපාර්ශවයටම හැකි වී තිබේ.

2013 වසර අවසාන වනවිට මිලියන 1.4 කට ආසන්න සක්‍රීය සාමාජිකයන්ගේ (දායක සාමාජිකයන්ගේ) ජාතික හැඳුනුම්පත් නැවත ලියාපදිංචි කිරීම යටතේ තොරතුරු රැස්කරගෙන තිබුණි. ඒ අතුරින් සියයට 79 (ගිණුම් මිලියන 1.1) කට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබාදී ඇති අතර, සෙසු සාමාජිකයන්ගේ රැස්කරන ලද තොරතුරු සහ පවතින තොරතුරු අතර නොගැලපීම් අදාළ සේවායෝජකයන් මගින් නැවත තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසුව ලියාපදිංචි කරමින් පැවතිනි.

සේ.අ.අ. නව සාමාජිකයන් තත්කාලීනව නැවත ලියාපදිංචි කිරීම 2010 නොවැම්බර් මාසයේ දී

ආරම්භ කරන ලදී. ඒ අනුව, පළමුවරට මාසික දායක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් වලින් තොරතුරු ලබා ගැනීම සඳහා මාසික නිරීක්ෂණ ක්‍රමයක් ද ක්‍රියාවෙහි යොදවා ඇත. 2013 දී, 130,000 ක් පමණ සාමාජිකයන් එලෙස ලියාපදිංචි කළ අතර, ඒ අනුව නව සාමාජික ලේඛන යාවත්කාලීන කරන ලදී.

සක්‍රීය සාමාජිකයන්ගේ පසුගිය සමස්ත ගිණුම් ඒකීය හඳුනා ගැනීමේ අංකයට (UID) සම්බන්ධ කිරීම, මෙම වසර තුළදී ද සිදු කරන ලදී. මෙම ක්‍රමය මගින් අන්තර්ජාලය හරහා සහ ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවාව හරහා ජා.හැ.ප. අංකය ඉදිරිපත් කිරීමෙන් සාමාජිකයන්ට තමන්ට හිමි සියළුම සාමාජික ගිණුම් පිළිබඳ තොරතුරු විමසීමට හැකියාව ලැබෙයි. 2013 වසර අවසානයේ දී සාමාජික ගිණුම් 565 ක් සම්බන්ධ වී ඇත.

2013 දී, සේ.අ.අ. අක්‍රිය සාමාජිකයන්ට ජා.හැ.ප. අංකය යටතේ නැවත ලියාපදිංචි කර ගැනීමට නව කවුළුවක් ඉදිරිපත් කරන ලදී.

## 2.10. විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය

සේ.අ.අරමුදල් දෙපාර්තමේන්තුව ක්‍රම ක්‍රමයෙන් තම සේවායෝජකයන්ට සාමාන්‍ය ගෙවීම් ක්‍රමයේ (සී හෝ සී3 වාර්තා) සිට විද්‍යුත් ගෙවීම් ක්‍රමයකට පරිවර්තනය වීමට දිරිගන්වන ලදී. තම සාමාජිකයන්ට වඩා විශිෂ්ට සේවාවක් සැපයීමෙහි ලා විද්‍යුත් මාධ්‍යයෙන් දත්ත සැපයීම (පූර්ණ කඩදාසි වලින් තොර විසඳුමක්) හැඳින්විය හැක්කේ එමගින් වියදම හා ප්‍රමාදය අඩුවීම හා ක්‍රියාවන්හි කාර්යක්ෂමතාව වැඩි වන බැවිනි. තවද, සේ.අ.අ. දායක මුදල් ගෙවීම හා ඒ පිළිබඳ විස්තර ලබා ගැනීමට විද්‍යුත් ක්‍රමයක් පැවතීම මගින් රටෙහි කරගෙන යන ව්‍යාපාර මට්ටම ඉහළ නැංවීමට පිටිවහලක් වේ. එය අන්තර් ජාතික ආයෝජන රට තුළට ආකර්ෂණය කර ගැනීමෙහිලා ඉතා වැදගත් වෙයි. 2012 වසර වන තුරු විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමය සිය කැමැත්තෙන් ක්‍රියාවට නැංවිය හැකි ක්‍රමයක් විය. 2012 වසරේ දී සේ.අ.අ. පනතට විධි විධාන ඇතුලත් කරමින් සංශෝධනය කරන ලද 2012 අංක 2 දරණ පනත මගින් මෙම ක්‍රමය සේවායෝජකයන්ට අනිවාර්ය කරන ලදී. 2013 මැයි මාසයේ දී සංශෝධනයට අදාළ නීති රෙගුලාසි ගැසට් කරන ලදී.

මෙම ක්‍රමය යටතේ සේ.අ.අ. මගින් බලපත්‍රලාභී වාණිජ බැංකු තම රැස්කිරීමේ නියෝජිතයන් ලෙස පත් කරන ලදී. ඒ අනුව, කොමර්ෂල් බැංකුව හා ලංකා බැංකුව පිළිවෙලින් 2011 ඔක්තෝබර් හා 2012 සැප්තැම්බර් සිට තම ගනුදෙනුකරුවන්ට විද්‍යුත් ගෙවීම් කිරීමේ පහසුකම සපයන ලදී. 2013 දී, මහජන බැංකුව, සම්පත් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව තම ක්‍රමවේද හඳුන්වා දෙමින් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස සේ.අ.අ. හා එක් වූයේ තම ගනුදෙනුකරුවන්ට වටිනාකමක් සහිත සේවාවක් ලබා දීමටය. මෙසේ තවත් වාණිජ බැංකු කිහිපයක්ම තම ගනුදෙනුකරුවන්ට ඒ හා සමාන සේවාවක් සැපයීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණික ක්‍රම සූදානම් කරමින් පවතී. 2013 වසර අවසානයේ දී, සේවායෝජකයින් 1,868 දෙනෙක් සාමාජික දායක මුදල් විස්තර හා ගෙවීම් විද්‍යුත් මගින් එවීමට ලියාපදිංචි වී ඇත. මුළු සක්‍රීය සාමාජිකයන් මිලියන 2.4 න් දැනට සියයට 40 ක් පමණ වූ මෙම සේවාව මගින් සේ.අ. අරමුදලේ සාමාජික ගිණුම් දායක මුදල් ලැබුණු සැනින් විධිමත්ව හා නිවැරදිව තත්කාලීන කිරීමට හැකිවී ඇත.

තවද, සෘජු හර කිරීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, එමගින් සේවා දායකයන්ට සෘජුවම මාසික දායක මුදල් තම ගිණුමෙන් සේ.අ.අ. ගිණුමට බැර කළ හැකි අතර, දායක මුදල් විස්තර විද්‍යුත් පණිවුඩ මගින් සේ.අ. අරමුදලට එවිය හැක. විද්‍යුත් මාධ්‍ය මඟින් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය පිළිබඳව සේවායෝජකයින් හා කම්කරු නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු 19 ක් 2013 වසරේ දී සේ.අ.අ. මගින් පවත්වා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලියාපදිංචි සේවාදායකයන් ගණන 2012 හි වූ 1,385 සිට 2013 දී 1,868 දක්වා වැඩි විය.

## 2.11. පිළිබිඹු ජායා පිටපත් ව්‍යාපෘතිය

තම සාමාජිකයන් හා සේ.අ.අ. අනෙකුත් ඇල්මැති පාර්ශවයන් සඳහා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමේ උපායමාර්ගික අරමුණ මුල් කර ගනිමින් ආරම්භ කළ පිළිබිඹු ජායා පිටපත් ව්‍යාපෘතිය මගින් දැනට පවතින ලේඛනගත මෙහෙයුම් පරිසරය, අවම ලේඛන සහිත විද්‍යුත් මාධ්‍යයන්ට පරිවර්තනය වෙයි. කඩදාසිමය ලියකියවිලි පරිහරණය සඳහා වැයවන කාලය, අවකාශය, පිරිවැය හා මානව සම්පත අවම කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය අදියර 4 ක් ඔස්සේ ක්‍රියාත්මක වෙයි.

(i). දැනට පවතින ලියකියවිලි ඡායාගත කිරීම.

මෙම කාර්යය සේවා සැපයුම්කරුවෙකුට පිරිනැමූ අතර, 2015 ජූලි 29 දින ගිවිසුම අත්සන් කරන ලදී. සකස් කරන ලද කාල සැලැස්මට අනුව, පවත්නා ප්‍රධාන ලිපිගොනු, ''ඩී'' ආකෘති පත්‍ර (සේවාදායකයන් ලියාපදිංචි කිරීමේ පෝරම) හා නැවත ලියාපදිංචි කිරීමේ ලිපිගොනු ඡායාගත කිරීම 2014 වසර අවසානයේ දී අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(ii). ලියකියවිලි තත්කාලීනව ඡායාගත කිරීම.

ලියකියවිලි එක්රැස්වීම වලක්වා ලීම සඳහා, ලැබුණු අවස්ථාවේදීම ලියකියවිලි ඡායාගත කිරීම 2014 දෙවන කාර්තුවේ දී ආරම්භ කිරීමට නියමිතය. 2013 වසරේ දී දෙපාර්තමේන්තුවට අදාළ පරිදි මෘදුකාංග අවශ්‍යතා මත මෘදුකාංග වැඩිදියුණු කිරීම සිදු කෙරෙමින් පවතී.

(iii). විද්‍යුත් දත්ත වාර්තා කාමරයක් පිහිටුවීම.

2014 මාර්තු මාසයේ දී මේ සඳහා අවශ්‍ය දෘඩාංග මිලදී ගැනීමට නියමිතයි.

(iv). ලේඛන කළමනාකරණ පද්ධතිය දැනට පවත්නා සේ.අ.අ. පරිගණක පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම.

ඉහත ප්‍රධාන අදියර 03 අවසන් වූ විට මෙම අදියර තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්වී සිදු කිරීමට නියමිතයි.

## 2.12. මහජනතාව දැනුවත් කිරීම

2013 වසරේ දී විද්‍යුත් ලේඛණ එක්රැස්කිරීමේ ක්‍රමය, සාමාජිකයින් නැවත ලියාපදිංචිය හා අනෙකුත් සාමාජිකයන් සම්බන්ධ සේවාවන් පිළිබඳව මහජන දැනුවත් කිරීම් හා ජංගම සේවාවන් පැවැත්වීම සඳහා දෙපාර්තමේන්තුව ප්‍රමුඛත්වය දී තිබුණි. සාමාජිකයින්, සේවායෝජකයින්, රැකියා ක්ෂේත්‍රයට ඇතුළුවූවන්, කම්කරු නිලධාරීන්, ග්‍රාමීය බැංකු නිලධාරීන් හා සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගනිමින් මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් හා ජංගම සේවාවන් 09 ක් පවත්වන ලදී. මෙම සියළු දැනුවත් කිරීමේ වැඩසටහන් විශාල සේවක සංඛ්‍යාවක් සිටින ආයතන වෙත අවධානය යොමු කරමින් පවත්වන ලදී. මාස් ඉන්ටිමේට්ස් - කුලියාපිටිය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව, දැයට කිරුළ ප්‍රදර්ශනය - අම්පාර, සෞඛ්‍ය හා ප්‍රජා සත්කාර දිනය - මොරටුව, ක්‍රිස්ටල් මාර්ටින් පුද්ගලික සමාගම - ගලගෙදර, ජාතික නමුණුකුල වතු සමාගම ඌව - බත්තරමුල්ල යන ආදියේ ජංගම සේවා පවත්වන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව ආදී වෙනත් ආයතන ද සම්බන්ධ කරගනිමින් මෙම කටයුතු සිදු කරන ලදී. පහත සඳහන් සේවාවන් සාමාජිකයන් වෙනුවෙන් ලබා දෙන ලදී.

(i). සේ.අ.අ. ශේෂ ප්‍රකාශන නිකුත් කිරීම.

(ii). සාමාජික ගිණුම් සංශෝධනය කිරීම.

(iii). සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම.

(iv). කෙටි පණිවුඩ සේවා හා අන්තර්ජාල පහසුකම් ආදී මාර්ගගත සාමාජික සේවාවන් ලියාපදිංචිය පිළිබඳව ප්‍රවර්ධනය කිරීම.

(v). සාමාජිකයන්ට උපදෙස් දීම.

(vi). සේ.අ.අ. සාමාජිකයන්ට ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අයදුම්පත් නිකුත් කිරීම.

(vii). සේ.අ.අ. සාමාජිකයන්ට උප්පැන්න සහතික /අනුමත වයස් සහතික ලබා ගැනීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කිරීම.

මීට අමතරව, මහජන සම්බන්ධතා හා විමසුම් කවුළුව සහ සේ.අ.අ. අත්වැල ද, කවුළුව ඔස්සේ, විද්‍යුත් තැපැල් මගින්, ලිපි, ෆැක්ස් පණිවුඩයන් සහ දුරකථන ඇමතුම් මගින් සිදු කරනු ලබන සේ.අ.අ. ක්‍රියාපටිපාටි පිළිබඳව සාමාජිකයන් දැනුවත් කරන ලදී. 2013 වසර තුළ දී මහජන සම්බන්ධතා හා විමසුම් කවුළුව හා සේ.අ.අ. අත්වැල, සාමාජික විමසීම් 222,498 කට ප්‍රතිචාර දක්වා ඇත. එයින් 118,380 ක් කවුළුව හරහා සාමාජිකයන්ට සේවාවන් සපයා ඇති අතර, 76,916 ක් දුරකථන විමසීම් ලෙසත්, විද්‍යුත් තැපැල් ඔස්සේ 16,057 ක් ද ලිපි 10,185 ක් හා ෆැක්ස් පණිවුඩ 960 ක් ද සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# ආදායම් හා වියදම් ප්‍රකාශනය

(රු.)

| | | 2013 | | | 2012 |
|---|---|---|---|---|---|
| | සටහන | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | |
| පොලී ආදායම් | 1 | 105,038,261,311 | - | 105,038,261,311 | 90,904,169,498 |
| ලාභාංශ ආදායම් | 2 | 3,226,229,672 | - | 3,226,229,672 | 1,996,329,740 |
| උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ / (අලාභ) | 3 | 1,127,566,932 | - | 1,127,566,932 | 1,054,177,803 |
| ක්‍රමක්ෂය ලාභ | 4 | 26,955,778,791 | - | 26,955,778,791 | 27,791,502,310 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ / (අලාභ) | 5 | (44,504,112) | - | (44,504,112) | (387,735,742) |
| **ආයෝජන ආදායම්** | | **136,303,332,593** | **-** | **136,303,332,593** | **121,358,443,609** |
| වෙනත් ආදායම් | **6** | 345,895,777 | 8,106,362 | 354,002,140 | 54,626,710 |
| **මුළු දළ ආදායම** | | **136,649,228,370** | **8,106,362** | **136,657,334,732** | **121,413,070,319** |
| මුළු මෙහෙයුම් වියදම් | 7 | (604,578,286) | (374,347,463) | (978,925,750) | (947,706,943) |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභය** | | **136,044,650,084** | **(366,241,101)** | **135,678,408,983** | **120,465,363,376** |
| අඩු කළා : ආදායම් බදු | **8** | (10,068,532,366) | - | (10,068,532,366) | (8,636,643,180) |
| **වසරේ මෙහෙයුම් ලාභය** | | **125,976,117,718** | **(366,241,101)** | **125,609,876,616** | **111,828,720,196** |
| එකතු කළා : පෙර වසරේ රඳවාගත් ලාභ | | | | 28,010,746 | 368,792,047 |
| එකතු කළා : පෙර වසරේ ගැලපීම් | 11 | | | 28,254,317 | - |
| **බෙදාහැරීම සඳහා ඇති ලාභය** | | | | **125,666,141,679** | **112,197,512,243** |
| අඩු කළා : වර්ෂය තුළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලී | | | | (2,233,490,165) | (2,098,085,270) |
| එකතු/ (අඩු) කළා : ලාභ සමකිරීමේ සංචිත අරමුදලෙන් / (අරමුදලට) මාරු කිරීම | | | | 3,700,000,000 | 5,700,000,000 |
| 2013.12.31 දිනට සාමාජික ශේෂ මත පොලිය-11.00% (2012-11.50%) | | | | (126,991,919,874) | (115,771,416,227) |
| **ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන යන ලද ශේෂය** | | | | **140,731,641** | **28,010,746** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(රු.)

| | සටහන | 2013 | 2012 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| වර්ෂය තුළ ලාභය | | 125,609,876,616 | 111,828,720,196 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම | 9 | 1,805,741,814 | (6,240,881,426) |
| කාලපරිච්ඡේදය සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම | | **127,415,618,431** | **105,587,838,770** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනට
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(රු.)

| | සටහන | 2013 | 2012 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ (ශුද්ධ පොත් අගයට) | 10 | 229,740,242 | 148,967,627 |
| ප්‍රාග්ධන නොනිම් වැඩ | 11 | 890,547,335 | 435,549,121 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | 8,223,942 | 435,495 |
| | | | |
| මූල්‍ය වත්කම් | 13 | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | | 1,126,941,275,632 | 980,371,915,815 |
| රුපියල් ණය | | 23,100,000,000 | 23,100,000,000 |
| භාණ්ඩාගාර බිල්පත් | | 13,587,399,142 | 31,757,671,753 |
| ලැයිස්තුගත කොටස් | | 63,263,646,500 | 54,744,901,555 |
| ලැයිස්තුගත නොකළ කොටස් | | 9,480,625,000 | 4,480,625,000 |
| සාංගමික ණයකර සහ භාරකාර සහතිකපත් | | 14,327,169,226 | 7,981,853,042 |
| ප්‍රති විකුණුම් | | 6,627,000,000 | 3,106,900,000 |
| | | **1,257,327,115,500** | **1,105,543,867,164** |
| | | | |
| ජංගම වත්කම් | | | |
| තොගය | | 18,065,752 | 12,416,925 |
| ලැබිය යුතු පොලී | | 34,375,440,761 | 30,807,809,156 |
| ලැබිය යුතු දායක මුදල් | | 7,264,552,149 | 6,239,874,709 |
| වෙනත් ජංගම වත්කම් සහ ලැබිය යුතු මුදල් | 14 | 1,521,042,677 | 1,254,862,633 |
| මුදල් හා මුදල් සමාන දෑ | 15 | 2,408,928,759 | 2,377,212,886 |
| | | **45,588,030,098** | **40,692,176,309** |
| අඩු කළා : ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | 16 | 5,723,796 | 10,366,364 |
| උපචිත වියදම් | | 150,338,731 | 240,005,104 |
| වෙනත් ජංගම වගකීම් | 17 | 3,913,575,001 | 2,161,788,601 |
| | | **(4,069,637,527)** | **(2,412,160,069)** |
| ශුද්ධ ජංගම වත්කම් | | **41,518,392,571** | **38,280,016,241** |
| | | | |
| මුළු ශුද්ධ වත්කම් | | **1,299,974,019,589** | **1,144,408,835,648** |
| | | | |
| නියෝජනය කරනු ලබන්නේ | | | |
| | | | |
| සාමාජික ශේෂ | 18 | 1,281,854,849,565 | 1,124,508,128,334 |
| | | | |
| සංචිත | 19 | 17,978,438,383 | 19,872,696,568 |
| රඳවාගත් ලාභ | | 140,731,641 | 28,010,746 |
| | | **18,119,170,024** | **19,900,707,314** |
| | | | |
| අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම | | **1,299,974,019,589** | **1,144,408,835,648** |

පිටු අංක 8 සිට 35 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
මුදල් මණ්ඩලය වෙනුවෙන්

අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

පී.ඩබ්ලිව්.ඩී.එන්.ආර්.රොද්‍රිගු
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2014 පෙබරවාරි 17

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# ලැබීම් හා ගෙවීම් ගිණුම

(රු.)

| | සටහන | 2013 | | | 2012 |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| වසරේ ආරම්භක මුදල් ශේෂය | | **2,377,212,886** | **44,911,739** | **2,422,124,625** | **2,073,227,694** |
| එකතු කළා : මුළු ලැබීම් | 20 | 229,029,063,905 | 1,007,032,835 | 230,036,096,740 | 179,156,397,522 |
| අඩු කළා : මුළු ගෙවීම් | 21 | 228,997,348,030 | 948,144,933 | 229,945,492,963 | 178,807,510,593 |
| වසර අවසාන මුදල් ශේෂය | | **2,408,928,759** | **103,799,642** | **2,512,728,402** | **2,422,114,625** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(රු.)

| විස්තරය | 2013 | 2012 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් | | |
| ආයෝජන මගින් ලද පොලී | 98,698,057,389 | 83,928,914,594 |
| කොටස් වලින් ලද ලාභාංශ | 2,886,142,528 | 1,881,100,206 |
| අධිභාර සහ වෙනත් ආදායම් | 346,252,668 | 56,715,848 |
| ණයගැතියන්ගෙන් අයකර ගැනීම් | 2,469,221 | - |
| මෙහෙයුම් වියදම් | (828,410,501) | (645,754,880) |
| අත්තිකාරම් | (31,625,921) | (1,702,500) |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | (2,396,466,159) | (2,092,881,197) |
| මෙහෙයුම් වලින් උත්පාදනය කරන ලද මුදල් | **98,676,419,225** | **83,126,392,071** |
| බදු ගෙවීම් | (31,030,731,549) | (18,918,362,215) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් | **67,645,687,677** | **64,208,029,856** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් | | |
| ආයෝජන | (763,359,631,755) | (487,822,962,364) |
| ආයෝජන කල්පිරීම් | 619,419,455,910 | 380,190,465,395 |
| භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර සහ කොටස් විකිණීම තුළින් උත්පාදනය කරන ලද මුදල් | 46,925,727,535 | 22,542,712,078 |
| ආයෝජන තුළින් උත්පාදනය කරන ලද මුදල් | **(97,014,448,310)** | **(85,089,784,891)** |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් | (119,936,511) | (92,871,587) |
| ඉදිකෙරෙමින් පවතින වත්කම් | (448,000,000) | (98,903,651) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය | **(97,582,384,822)** | **(85,281,560,130)** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් | | |
| දායක මුදල් | 80,176,396,756 | 70,170,727,965 |
| පොදු තැන්පතු | 139,298,344 | 10,882,301 |
| ප්‍රතිලාභ ගෙවීම් | (50,243,482,439) | (48,711,597,845) |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් | **30,072,212,662** | **21,470,012,421** |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ (අඩු) / වැඩි වීම් | **135,515,517** | **396,482,148** |
| වර්ෂය ආරම්භක දිනට මුදල් හා මුදල් සමාන දෑ | **2,377,212,886** | **2,025,632,477** |
| වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ - ගැළපුම්වලට පෙර | **2,512,728,403** | **2,422,124,625** |
| ගැළපීම් : කම්කරු දෙපාර්තමේන්තුවේ වර්ෂ අවසාන මුදල් ශේෂය | **(103,799,642)** | **(44,911,739)** |
| වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ | **2,408,928,760** | **2,377,212,886** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනට
# ආයෝජන ප්‍රකාශනය

(රු.)

| 2013 | | | | | ආයෝජන කාණ්ඩය | සටහන් | 2012 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුහුණත අගය | පිරිවැය | ක්‍රමක්ෂය අගය | වෙළෙඳපොළ අගය | පොත් අගය | | | මුහුණත අගය | පිරිවැය | ක්‍රමක්ෂය අගය | වෙළෙඳපොළ අගය | පොත් අගය |
| 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | රුපියල් ණය | 24 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 |
| 1,356,388,637,000 | 1,097,409,813,289 | 1,126,126,980,931 | 1,190,953,799,549 | 1,126,941,275,632 | භාණ්ඩාගාර බැඳුම්කර | 23, 24 | 1,117,360,267,000 | 939,109,002,211 | 980,371,915,815 | 950,709,557,308 | 980,371,915,815 |
| 13,968,793,000 | 12,575,597,836 | 12,575,597,836 | 13,587,399,142 | 13,587,399,142 | භාණ්ඩාගාර බිල්පත් | 23 | 33,409,900,000 | 30,962,701,825 | 31,757,671,753 | 31,811,458,284 | 31,757,671,753 |
| 6,627,000,000 | 6,627,000,000 | 6,627,000,000 | 6,627,000,000 | 6,627,000,000 | ප්‍රති විකුණුම් | 25 | 3,106,900,000 | 3,106,900,000 | 3,106,900,000 | 3,106,900,000 | 3,106,900,000 |
| 11,106,379,600 | 11,106,379,600 | 11,106,379,600 | 11,106,379,600 | 11,106,379,600 | සාංගමික ණයකර | 22, 23, 24 | 5,316,930,000 | 5,316,930,000 | 5,316,930,000 | 5,316,930,000 | 5,316,930,000 |
| - | - | - | - | - | උකස් සුරැකුම්පත් | | 500,000,000 | 500,000,000 | 500,000,000 | 500,000,000 | 500,000,000 |
| 3,774,661,584 | 2,759,800,000 | 3,220,789,626 | 3,220,789,626 | 3,220,789,626 | භාරකාර සහතිකපත් | 24 | 2,493,372,496 | 1,942,880,973 | 2,164,923,042 | 2,164,923,042 | 2,164,923,041 |
| - | 71,690,881,118 | 71,690,881,118 | 63,277,367,343 | 63,263,646,500 | ලැයිස්තුගත කොටස් | 22, 23 | - | 63,102,761,384 | 63,102,761,384 | 54,744,901,555 | 54,744,901,555 |
| - | 9,480,625,000 | 9,480,625,000 | 9,480,625,000 | 9,480,625,000 | ලැයිස්තුගත නොවන කොටස් | 23 | - | 4,480,625,000 | 4,480,625,000 | 4,480,625,000 | 4,480,625,000 |
| **1,414,965,471,184** | **1,234,750,096,845** | **1,263,928,254,111** | **1,321,353,360,260** | **1,257,327,115,500** | එකතුව | | **1,185,287,369,496** | **1,071,621,801,393** | **1,113,901,726,994** | **1,075,935,295,189** | **1,105,543,867,164** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# හිමිකම් ප්‍රාග්ධනයේ/සාමාජිකයන්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය

(රු.)

| විස්තරය | සාමාජික ශේෂය | ගොඩනැගිලි සංචිත අරමුදල | තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල | ලාභ සම කිරීමේ සංචිත අරමුදල | පොදු සංචිත අරමුදල | ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 2011.12.31 දිනට ශේෂය | **986,045,958,691** | **3,157,000,000** | **350,000,000** | **23,500,000,000** | **6,650,000,000** | **(2,367,430,983)** | **368,792,048** | **1,017,704,319,756** |
| පෙර වසරේ ගැළපීම් | - | - | - | - | - | - | - | **-** |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම | - | - | - | - | - | (6,240,881,426) | - | **(6,240,881,426)** |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් ලාභයට මාරු කිරීම | - | - | - | - | - | 524,008,977 | - | **524,008,977** |
| 2012 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 111,828,720,196 | **111,828,720,196** |
| ශුද්ධ දායක මුදල් | 22,690,753,416 | - | - | - | - | - | - | **22,690,753,416** |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම් 2012 | - | - | - | - | - | - | (2,098,085,270) | **(2,098,085,270)** |
| සාමාජික පොලී (2012 : 11.50%) | 115,771,416,227 | - | - | - | - | - | (115,771,416,227) | **-** |
| රඳවාගත් ලාභයට මාරු කිරීම | - | - | - | (5,700,000,000) | - | - | 5,700,000,000 | **-** |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,124,508,128,334** | **3,157,000,000** | **350,000,000** | **17,800,000,000** | **6,650,000,000** | **(8,084,303,432)** | **28,010,747** | **1,144,408,835,648** |
| පෙර වසරේ ගැළපීම් | - | - | - | - | - | - | 28,254,317 | **28,254,317** |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම | - | - | - | - | - | 1,805,741,814 | - | **1,805,741,814** |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් ලාභයට මාරු කිරීම | - | - | - | - | - | - | - | **-** |
| 2013 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 125,609,876,616 | **125,609,876,616** |
| ශුද්ධ දායක මුදල් - 2013 | 30,354,801,358 | - | - | - | - | - | - | **30,354,801,358** |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම් 2013 | - | - | - | - | - | - | (2,233,490,165) | **(2,233,490,165)** |
| සාමාජික පොලී (2013 : 11.00%) | 126,991,919,874 | - | - | - | - | - | (126,991,919,874) | **-** |
| රඳවාගත් ලාභයට මාරු කිරීම | - | - | - | (3,700,000,000) | - | - | 3,700,000,000 | **-** |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,281,854,849,565** | **3,157,000,000** | **350,000,000** | **14,100,000,000** | **6,650,000,000** | **(6,278,561,616)** | **140,731,641** | **1,299,974,019,589** |

# සේවක අර්ථසාධක අරමුදල
# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වාර්තාකරණ ආයතනය හා ව්‍යවස්ථාපිත පදනම

සේවක අර්ථසාධක අරමුදල (''සේ.අ.අ.'' හෝ ''අරමුදල'') යනු 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා වෙළෙඳ අංශයේ සේවකයන් සඳහා ඇති කරන ලද අනිවාර්ය දායකත්ව විශ්‍රාම ක්‍රමය වේ. අරමුදලේ පොදු පරිපාලන කටයුතු කම්කරු කොමසාරිස්වරයා සතු වන අතර, අරමුදලේ භාරකරු ලෙස වගකීම දරණුයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වේ.

1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ 5 (1) (ඌ) සහ (එ) වගන්ති යටතේ, මුදල් මණ්ඩලය විසින් අරමුදලට අදාළ පොදු ගිණුම් පවත්වාගෙන යාම සහ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කිරීම කළ යුතු වේ.

අ. ආදායම් හා වියදම් ප්‍රකාශය,

ආ. වත්කම් හා වගකීම් ප්‍රකාශය,

ඇ. ලැබීම් හා ගෙවීම් ප්‍රකාශය හා

ඈ. එක් එක් ආයෝජනයේ මුහුණත වටිනාකම, මිලදී ගත් පිරිවැය හා වෙළෙඳපොළ වටිනාකම දක්වමින් ආයෝජන ප්‍රකාශය,

## 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. අරමුදලේ මූල්‍ය වාර්තා වෙනත් ලෙසකින් දක්වා නොමැති විට ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

### 2.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ඇතුළත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පනවා ඇති නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කර ඇත. මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත, අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය මගින් නිකුත් කරන ලද අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත හා බොහෝ සෙයින් ගැළපේ.

### 2.3 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මෙම නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ක්‍රියාත්මක වන දිනය වන්නේ 2012 ජනවාරි 1 දින සිට වන බැවින් ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, ක්‍රම සහ ඉදිරිපත් කිරීම් වෙනස් කර හෝ වැඩි දියුණු කර ඇති අතර සැලකිය යුතු වෙනස්කම් පහත දක්වා ඇත. එම වෙනස්කම

සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කරන ලද ඉදිරිපත් කිරීමේ වැඩි දියුණු කිරීම් හැර අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වසර හා සමාන වේ.

### 2.4 ඇස්තමේන්තු හා උපකල්පන භාවිතය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනාගත තත්ත්වයන් පිළිබඳව ඇස්තමේන්තු හා උපකල්පන අවශ්‍ය වේ. තිබෙන තොරතුරු යොදා ගැනීම සහ විනිශ්චයන් භාවිතා කිරීම ඇස්තමේන්තු කිරීමේ දී ආවේණික වේ. අනාගතයේ සත්‍ය ප්‍රතිඵල මූල්‍ය තොරතුරු පිළියෙල කිරීම සඳහා යොදාගත් ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍යයෙන් යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වන්නේ මූල්‍ය වත්කම් තක්සේරු කිරීම, වත්කම් හානිකරණය, දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම, විලම්භිත බදු වත්කම් හා වගකීම සඳහා වෙන් කිරීම් වේ.

### 2.5 අඛණ්ඩ පැවැත්ම

අරමුදල සතුව සසම්භාවි අනාගතයකට අවශ්‍ය වන සම්පත් පවතින බැවින්, අඛණ්ඩ පැවැත්මක් පිළිබඳව සෑහීමකට පත්ව ඇත. එම නිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කර ඇත.

### 2.6 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම හා අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙළ කිරීමේ දී ශේෂ පත්‍ර දිනට පසු සිදුවූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා ඇත. සියළුම දැනගැනීමට ඇති වගකීම් සඳහා වෙන්කිරීම් සිදුකර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය.

### 3.1 මූල්‍ය වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම්

#### 3.1.1 මූල්‍ය වත්කම් හඳුනාගැනීම හා ඇගයීම

අරමුදල මූල්‍ය උපකරණයක් හා සම්බන්ධ ගිවිසුමක එක් පාර්ශ්වකරුවකු බවට පත්වූවිට පමණක් මූල්‍ය වත්කමක් හඳුනාගනු ලබයි. මූල්‍ය වත්කම් යන්නට මූලිකව අඩංගු වන්නේ කල් පිරෙන තෙක් තබාගෙන ඇති ආයෝජන, ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට සුරැකුම්පත්, ණය සහ ලැබිය යුතු මුදල් සහ විකිණීමට ඇති ආයෝජයන්ය. සියළුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ අගයෙහි වටිනාකමට හුවමාරු වූ නිසා පිරිවැයට හඳුනාගනු ලබන අතර, ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් හැර අනෙකුත් ඒවාට අදාළ ගනුදෙනුවේ පිරිවැය සහ අත්කර ගැනීමට අදාළ වියදම් එකතු කරනු ලැබේ.

මූල්‍ය වත්කම්වල වර්ගීකරණය හා පසු අගය කිරීමේ පදනම් පහත පරිදි වේ.

#### (අ) කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන

කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලබන්නේ කල් පිරෙන තුරු තබා ගැනීමට අපේක්ෂාවක් සහ හැකියාවක් ඇති ස්ථිර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරීමක් ඇති මූල්‍ය වත්කම් වේ. කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන පසුව අගය කරනු ලබන්නේ සඵල පොලී අනුපාතිකය භාවිතයෙන් (යම් හානිකරණ අඩු කළ පසු) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත වේ. මෙම ආයෝජන

අත්පත්කර ගැනීමේ දී වන අධි මිල සහ වට්ටම්, සඵල පොලී අනුපාතය ගණනයේ දී යොදා ගනු ලැබේ. කල් පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන හානිකරණය හෝ පොත් වලින් ඉවත් කිරීමක් මත වන ලාභ හා අලාභ, ආදායම් ප්‍රකාශයේ ගළපනු ලැබේ.

**(ආ) ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා තබාගෙන ඇති මූල්‍ය වත්කම් සහ මූලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට ඇති සුරකුම් ලෙස නම් කළ වත්කම්, ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට ඇති සුරැකුම් පත් යටතේ වර්ගීකරණය කරනු ලැබේ. මේවායේ අදාළ ගණුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් පසුව අගය කරනු ලබන්නේ වෙළෙඳපොළ වටිනාකමක් අගවනු ලබන සාධාරණ අගයටය. වෙළෙඳපොළ අගයන්ගේ වෙනස්වීම් සුරැකුම්පත්වල වටිනාකම ඉහළ හෝ පහළ යාමක් ලෙස හඳුනාගන්නා අතර, එමගින් වන ශුද්ධ ලාභය සහ අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

**(ඇ) ණය හා ලැබිය යුතු මුදල්**

සක්‍රිය වෙළෙඳපොළක මිල ප්‍රකාශ නොවන ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු මුදල් යටතේ වර්ගීකරණය කරයි. නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් (ප්‍රති විකිණුම්) ද ණය හා ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය කෙරේ. ණය හා ලැබිය යුතු මුදල් පසුව අගය කිරීම කරනුයේ සඵල පොලී ක්‍රමය යටතේ ක්‍රමක්ෂය පිරිවැයටය. (යම් හානිකරණයක් අලාභ වෙතොත් එය අඩු කිරීමෙන් අනතුරුවය.)

(ඈ) **විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්**

ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට ඇති සුරැකුම් වර්ගීකරණය නොකරන ලද කොටස් ආයෝජන, ඉහත වර්ග තුන යටතේ වර්ගීකරණය නොකරන ලද ණය උපකරණ සහ මූලික අත්පත් කර ගැනීමේදී විකිණීම සඳහා ඇති ආයෝජන ලෙස නම් කරන ලද සුරැකුම්පත්, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

විකිණීම සඳහා ඇති වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ අගය මත තවදුරටත් අගය කරනු ලැබේ. මෙම වත්කම්හි සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීරණ ආදායම් ලෙස හඳුනාගන්නා අතර එම වත්කම් විකුණන තෙක් හෝ හානිකරණය වන තෙක් ප්‍රත්‍යාගණන සංචිත වශයෙන් සාමාජිකයන්ගේ ශුද්ධ අගයට සමුච්චිත කරනු ලැබේ.

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හානිකරණයේදී ධාරණ පිරිවැය හා වර්තමාන සාධාරණ අගය අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ ගළපනු ලැබේ. විකිණීමට ඇති ණය සුරැකුම්පත්වල පොලී ආදායම සඵල පොලී අනුපාත ක්‍රමයට හඳුනා ගනු ලැබේ. ලාභාංශ ලැබීමට හිමිකම් ලද විට ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**3.1.2 මූල්‍ය වත්කම් හානිකරණය**

සෑම ශේෂ පත්‍ර දිනකදීම මූල්‍ය වත්කමක් හානිකරණය වූවාද යන්න පිළිබඳ කිසියම් විෂය මූලික සාක්ෂි තිබේ දැයි තක්සේරු කළ යුතුය. හානිකරණ අලාභ හඳුනා ගනු ලබන්නේ

මූල්‍ය වත්කම මුල් වශයෙන් හඳුනා ගැනීමෙන් පසු සිදු වූ (පාඩු ගෙනදෙන) එක් සිද්ධියක් සිද්ධි වැඩි ගණනකදී ප්‍රතිඵලයක් ලෙස හානිය සිදුවූ බවට විෂය මූලික සාක්ෂි තිබේනම් හා එම සිද්ධිය (සිද්ධි) විශ්වාසනීය මට්ටමින් ඇස්තමේන්තු කල හැකි ආකාරයන් අනාගත මුදල් ගලා ඒම් කෙරෙහි තද බලපෑමක් තිබේ නම් පමණකි.

නිකුත් කරන්නාගේ සැලකිය යුතු කරමේ මූල්‍ය දුෂ්කරතා, පැහැරහැරීම් වැනි ගිවිසුම් කඩ කිරීමත් බුන්වත් වීම් සහ අනෙකුත් මූල්‍ය ආපදා වැනි නිශ්චිත තොරතුරු මෙන්ම සුරැකුම්පතෙහි පිරිවැය ආවරණය කරගත නොහැකි වන අන්දමේ වෙළෙඳපොළ තත්ත්වයෙහි සැලකිය යුතු වෙනස්වීම් පිළිබඳව තොරතුරු ද සුරැකුම්පත් හානිකරණය වූ බවට විෂය මූලික සාක්ෂි වේ. වත්කමක සාධාරණ අගය සැලකිය යුතු ලෙස හෝ දිගින් දිගට එහි පිරිවැයට වඩා පහත වැටීමක් ද හානිකරණය සඳහා වූ විෂය මූලික සාක්ෂියක් වේ. සැලකිය යුතු වෙනස්වීම් යන්න ඇගයීමේ දී මූලික හඳුනාගැනීමේ දී වත්කමෙහි මුල් පිරිවැය, එහි සාධාරණ අගයෙහි පහළ යාම සමඟ සසඳා බැලේ. දිගින් දිගටම පහළ යාම ඇගයීමේ දී වත්කමේ මූලික හඳුනාගැනීමේදී එහි මුල් පිරිවැයට වඩා සාධාරණ අගය පහළ ගිය කාලය සැලකිල්ලට ගනු ලැබේ.

### 3.1.3 මූල්‍ය වත්කම් හඳුනා ගැනීම අත් හැරීම

වත්කම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහයන් සඳහා වූ ගිවිසුම්ගත අයිතිය කල් ඉකුත් වීමෙන් හෝ අරමුදල විසින් මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය පැවරීම මගින් හෝ එමෙන්ම,

- ප්‍රමාණාත්මක ලෙස අයිතියට අදාළ සියළුම අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම

  හෝ,

- අරමුදල ප්‍රමාණාත්මක ලෙස සියළුම අවදානම් සහ ප්‍රතිලාභ රඳවා නොගැනීම හෝ පැවරීම ද නොකල ද, පාලනය රඳවා නොගත් විට ද මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත් හරියි.

## 3.2 අනෙකුත් වත්කම්

### 3.2.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීම් හා සමුච්චිත හානිකරණය අඩුකර ඇති වටිනාකමටය. දේපළ, පිරියත හා උපකරණ සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමයට පහත දක්වා ඇති අනුපාත යටතේ ඒවායේ පිරිවැය ඇස්තමේන්තුගත සඵල ජීවකාලය පුරා ක්‍ෂය වශයෙන් ලියාහරිනු ලැබේ.

| වත්කම් වර්ගය | ක්ෂය අනුපාතය |
|---|---|
| ගොඩනැගිලි | 02% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| කාර්යාල උපකරණ | 25% |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10% |
| මෝටර් රථ | 20% |

| | |
|---|---|
| පරිගණක උපාංග | 50% |
| වෙනත් | 20% |

දේපළ, පිරියත උපකරණවල සාධාරණ අගය ආපසු අයකරගත නොහැකි බව පෙන්නුම් කෙරෙන සිදුවීම් හෝ වෙනස්වීම් ඇති විට දී එම සාධාරණ අගයන් හානිකරණය සඳහා සමාලෝචනය  කරනු ලබයි.

තවද, විකිණීම මත හෝ පාවිච්චියෙන් හෝ විකිණීමෙන් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ රහිත වීම මත හෝ දේපළ, පිරියත උපකරණ හඳුනා ගැනීම අත් හැරීමෙන් කිසියම් ලාභයක් හෝ අලාභයක් වේ නම් එය හඳුනා ගැනීම අත් හැරි වර්ෂයට අදාළ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

### 3.2.2 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගයන්හි අවශ්‍යම කොටසක් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලබන අතර, ඒවා පිරිවැයට හඳුනාගනු ලබයි.  මූලික හඳුනාගැනීමෙන් පසුව ඒවා පිරිවැයෙන් වසර 2 ක ඵලදායී ජීව කාලය මත පදනම් වූ සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ අගයට ඉදිරියට ගෙන යනු ලබයි.

### 3.2.3 තොග

තොග පවත්වාගෙන යනු ලබන්නේ බර තැබූ සාමාන්‍ය පිරිවැයට වේ. මන්දගාමීව සංචලනය වන තොග සඳහා දීමනා වෙන් කරනු ලබයි.

### 3.2.4 ලැබිය යුතු මුදල්

ලැබිය යුතු මුදල් විෂය මූලික සාක්ෂි මත පදනම් වූ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු අපේක්ෂිත උපලබ්ධි අගය මත ඉදිරියට ගෙන යනු ලබයි.

### 3.2.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම මූල්‍ය කාලපරිච්ඡේදයකම අවසානයේදී අරමුදල විසින් මූල්‍ය නොවන වත්කම් හානිකරණය වීමක් පිළිබඳ සංඥාවක් ලැබෙන වෙනස්වීමක් සිදුවී ඇති විට හෝ සිදුවීමක් වූ බවට තක්සේරු කරනු ලබයි. එවැනි සංඥාවක් දැනටමත් පවතී නම් ආපසු අයකර ගත හැකි අගය පිළිබඳ මූල්‍ය ඇස්තමේන්තුවක් අරමුදල විසින් කරනු ලබයි.  එම ආපසු අයකරගත හැකි අගයට වඩා (ධාරණ අගය) වැඩි නම්, එම වත්කම හානිකරණය වූ බවට සලකා ආපසු අයකර ගත හැකි අගය දක්වා ලියාහරිනු ලැබේ.

## 3.3 වගකීම්

### 3.3.1 හිමිකම් නොපෑ ප්‍රතිලාභ

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම සාමාජිකයන්ට හෝ අර්ථලාභීන්ට ලබා දුන් නමුත් විවිධ හේතු මත ආපසු එවූ හා රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ වසරකට වඩා රඳවා ගනු ලැබූ ප්‍රතිලාභ නැවත ලබා දෙනතුරු හිමිකම් නොපෑ ප්‍රතිලාභ ගිණුමට බැර කරන ලදී.

### 3.3.2 රඳවාගත් ප්‍රතිලාභ

රඳවාගත් ප්‍රතිලාභ යටතේ දක්වා ඇති අගයන් කම්කරු කොමසාරිස්වරයාගේ උපදෙස් මත රඳවාගත් ප්‍රතිලාභ වන අතර, ඔහු විසින් නැවත ඉල්ලා සිටි විට නිදහස් කරනු ලබයි. මෙවැනි බැර කිරීම් එම ගිණුමේ පවත්වාගෙන යනු ලබන්නේ එක් ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා පමණි.

### 3.3.3 ඌණ සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම්

ඌණ සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් ගිණුමේ ශේෂයෙන් පෙන්වන්නේ කොටස් වශයෙන් කළ ප්‍රතිලාභ ගෙවීම් වේ.

### 3.3.4 ප්‍රතිපාදන

| නවලෝක හොස්පිට්ල්ස් පී.එල්.සී. | 114,500,000 | 114,500,000 | 114,500,000 | 114,500,000 |
| පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී | 250,000,000 | 250,000,000 | 250,000,000 | 250,000,000 |
| පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් සමාගම පී.එල්.සී. | 105,900,000 | 105,900,000 | 105,900,000 | 105,900,000 |
| සම්පත් බැංකුව පී.එල්.සී. | 14,430,000 | 14,430,000 | 14,430,000 | 14,430,000 |
| සම්පත් බැංකුව පී.එල්.සී. | 251,775,000 | 251,775,000 | 251,775,000 | 251,775,000 |
| සම්පත් බැංකුව පී.එල්.සී. | 170,095,000 | 170,095,000 | 170,095,000 | 170,095,000 |
| සෙලාන් බැංකුව පී.එල්.සී. | 100,000,000 | 100,000,000 | 100,000,000 | 100,000,000 |
| සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී. | 33,214,000 | 33,214,000 | 33,214,000 | 33,214,000 |
| සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී. | 123,306,000 | 123,306,000 | 123,306,000 | 123,306,000 |
| සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී. | 93,576,000 | 93,576,000 | 93,576,000 | 93,576,000 |
| සිංගර් ශ්‍රී ලංකා පී.එල්.සී. | 31,193,400 | 31,193,400 | 31,193,400 | 31,193,400 |
| සිංගර් ශ්‍රී ලංකා පී.එල්.සී. | 46,790,100 | 46,790,100 | 46,790,100 | 46,790,100 |
| එස්.එම්.අයි.බී බැංකුව | 195,000,000 | 195,000,000 | 195,000,000 | 195,000,000 |
| ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | 195,000,000 | 195,000,000 | 195,000,000 | 195,000,000 |
| ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | 65,580,000 | 65,580,000 | 65,580,000 | 65,580,000 |
| ද ලයන් බෲවරි (සිලෝන්) පී.එල්.සී. | 39,900,000 | 39,900,000 | 39,900,000 | 39,900,000 |
| ද ලයන් බෲවරි (සිලෝන්) පී.එල්.සී. | 39,900,000 | 39,900,000 | 39,900,000 | 39,900,000 |
| ද ලයන් බෲවරි (සිලෝන්) පී.එල්.සී. | 53,200,000 | 53,200,000 | 53,200,000 | 53,200,000 |
| උප එකතුව | **9,594,281,100** | **9,594,281,100** | **9,594,281,100** | **9,594,281,100** |

(රු.)

| භාරකාර සහතිකපත් | මුහුණත අගය | මිලදීගැනීමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| එල්.බී.ෆිනෑන්ස් පී.එල්.සී. | 983,474,896 | 722,900,000 | 853,774,990 | 853,774,990 |
| පීපල්ස් ලීසිං සමාගම පී.එල්.සී. | 2,589,245,308 | 1,878,900,000 | 2,181,739,235 | 2,181,739,235 |
| සෙංකඩගල ෆිනෑන්ස් පී.එල්.සී. | 201,941,380 | 158,000,000 | 185,275,402 | 185,275,402 |
| උප එකතුව | **3,774,661,584** | **2,759,800,000** | **3,220,789,626** | **3,220,789,626** |
| | | | | |
| මුළු එකතුව | **1,381,473,579,684** | **1,123,088,236,725** | **1,216,278,917,910** | **1,152,266,393,993** |

## සේවක අර්ථසාධක අරමුදල
## 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශනයට අදාළ සටහන්

### 25. ණය හා ලැබිය යුතු දෑ

ප්‍රති විකුණුම් ගිවිසුම් (රු.)

| ව්‍යාපාර සහකරු | අනුපාතය | මුහුණත අගය | පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|---|---|
| දේශීය කටයුතු දෙපාර්තමේන්තුව | 7.30 | 2,000,000,000 | 2,000,000,000 | 2,000,000,000 |
| ලංකා බැංකුව | 5.76 | 511,000,000 | 511,000,000 | 511,000,000 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 6.90 | 750,000,000 | 750,000,000 | 750,000,000 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 6.95 | 1,500,000,000 | 1,500,000,000 | 1,500,000,000 |
| පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් සමාගම | 6.95 | 145,000,000 | 145,000,000 | 145,000,000 |
| සෙලාන් බැංකුව පී.එල්.සී. | 6.90 | 945,000,000 | 945,000,000 | 945,000,000 |
| ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් | 7.05 | 250,000,000 | 250,000,000 | 250,000,000 |
| ජාතික සංවර්ධන බැංකුව | 6.90 | 526,000,000 | 526,000,000 | 526,000,000 |
| මුළු එකතුව | | **6,627,000,000** | **6,627,000,000** | **6,627,000,000** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශනයට අදාළ සටහන්

## 26. ආයෝජනයන්හි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

(රු.)

| ආයෝජන වර්ගය | ආරම්භක ශේෂය | ආයෝජන | කල්පිරීම | විකුණුම් | මාරු කිරීම් | ක්‍රමක්ෂය | අවසාන ශේෂය | 2013 | 2012 | වෙනස්වීම් % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලාභ හෝ අලාභ සාධාරණ අගයට ආයෝජන | | | | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 231,837,950 | - | 231,837,950 | - | - | - | - | - | - |
| ලැයිස්තුගත කොටස් | 147,603,472 | 535,615,945 | - | 161,451,059 | (49,020,597) | - | 472,747,761 | 0.0 | 0.0 | 0.0 |
| සාංගමික ණයකර | - | 114,500,000 | - | - | - | - | 114,500,000 | 0.0 | - | 0.0 |
| **උප එකතුව - ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට ආයෝජන** | **147,603,472** | **881,953,895** | **-** | **393,289,009** | **(49,020,597)** | **-** | **587,247,761** | **0.0** | **0.0** | **0.0** |
| විකිණීමට තබා ඇති ආයෝජන | | | | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 15,879,012,869 | - | 6,181,159,611 | - | 892,099,107 | 10,589,952,365 | 0.8 | - | 0.8 |
| භාණ්ඩාගාර බිල්පත් | - | 27,913,070,203 | 5,372,593,000 | 10,235,609,479 | 1,282,531,418 | - | 13,587,399,142 | 1.1 | - | 1.1 |
| ලැයිස්තුගත කොටස් | 54,597,298,083 | 8,234,193,013 | - | 97,548,760 | - | 56,956,403 | 62,790,898,739 | 5.0 | 4.9 | 0.1 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 4,480,625,000 | 5,000,000,000 | - | - | - | - | 9,480,625,000 | 0.8 | 0.4 | 0.3 |
| සාංගමික ණයකර | - | 1,397,598,500 | - | - | - | - | 1,397,598,500 | 0.1 | - | 0.1 |
| **උප එකතුව - විකිණීමට තබා ඇති ආයෝජන** | **59,077,923,083** | **58,423,874,585** | **5,372,593,000** | **16,514,317,850** | **1,282,531,418** | **949,055,510** | **97,846,473,745** | **7.8** | **5.3** | **2.4** |
| කල්පිරෙන තෙක් තබාගෙන ඇති ආයෝජන | | | | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 980,371,915,815 | 350,490,343,097 | 204,816,388,416 | 27,057,294,183 | - | 17,362,746,955 | 1,116,351,323,267 | 88.8 | 88.7 | 0.1 |
| රුපියල් ණය | 23,100,000,000 | - | - | - | - | - | 23,100,000,000 | 1.8 | 2.1 | (0.3) |
| භාණ්ඩාගාර බිල්පත් | 31,757,671,753 | - | 33,409,900,000 | - | 1,652,228,247 | - | - | - | 2.9 | (2.9) |
| සාංගමික ණයකර | 5,316,930,000 | 4,577,351,100 | 300,000,000 | - | - | - | 9,594,281,100 | 0.8 | 0.5 | 0.3 |
| උකස් සුරැකුම්පත් | 500,000,000 | - | 500,000,000 | - | - | - | - | - | 0.0 | (0.0) |
| භාරකාර සහතිකපත් | 2,164,923,041 | 2,550,000,000 | 2,000,351,835 | - | - | 506,218,420 | 3,220,789,626 | 0.3 | 0.2 | 0.1 |
| **උප එකතුව - කල්පිරෙන තෙක් තබාගෙන ඇති ආයෝජන** | **1,043,211,440,609** | **357,617,694,197** | **241,026,640,252** | **27,057,294,183** | **1,652,228,247** | **17,868,965,375** | **1,152,266,393,993** | **91.6** | **94.4** | **(2.7)** |
| ණය හා ලැබිය යුතු ආයෝජන | | | | | | | | | | |
| ප්‍රති විකුණුම් | 3,106,900,000 | 1,002,204,402,375 | 998,684,302,375 | - | - | - | 6,627,000,000 | 0.5 | 0.3 | 0.2 |
| **උප එකතුව - ණය හා ලැබිය යුතු ආයෝජන** | **3,106,900,000** | **1,002,204,402,375** | **998,684,302,375** | **-** | **-** | **-** | **6,627,000,000** | **0.5** | **0.3** | **0.2** |
| මුළු එකතුව | **1,105,543,867,164** | **1,419,127,925,052** | **1,245,083,535,627** | **43,964,901,043** | **2,885,739,068** | **18,818,020,885** | **1,257,327,115,500** | **100.0** | **100.0** | **-** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශනයට අදාළ සටහන්

## 27. 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය

(රු.මිලියන)

| ආයෝජන කාණ්ඩය | අනුපාතය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2025 | 2026 | 2028 | 2032 | 2033 | 2043 | නිශ්චිත නොවූ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | | | | | | | | | | | | | | | | | | | |
| | 5.35 | | | | | | | | | | | | 89,247 | | | | | | 89,247 |
| | 5.65 | | | | | | 3,000 | | | | | | | | | | | | 3,000 |
| | 5.80 | | | | 45,464 | | | | | | | | | | | | | | 45,464 |
| | 6.20 | | 9,929 | | | | | 64,320 | | | | | | | | | | | 74,249 |
| | 6.40 | | | 34,974 | | | | | | | | | | | | | | | 34,974 |
| | 6.50 | | 19,081 | | | | | | | | | | | | | | | | 19,081 |
| | 6.60 | 62,447 | | | | | | | | | | | | | | | | | 62,447 |
| | 6.75 | | | | | | | | | | | | | | | | | | - |
| | 7.00 | 21,074 | | | | | | | | | 63,540 | | | | | | | | 84,614 |
| | 7.25 | | | 35,736 | | | | | | | | | | | | | | | 35,736 |
| | 7.50 | | | | | 46,814 | | | | | | | | | | | | | 46,814 |
| | 8.00 | | | 16,489 | 32,731 | 5,700 | 12,307 | 9,225 | | 52,781 | | | | | 64,047 | | | | 193,280 |
| | 8.50 | | 2,000 | | | 85,464 | 75,078 | | | | | | | | | | | | 162,542 |
| | 9.00 | 1,750 | | | | | | | 12,615 | | 6,000 | 9,944 | 20,200 | 177,980 | 31,845 | 119,215 | 30,676 | | 410,225 |
| | 10.50 | | | | | | | | | | | | | | | | | | - |
| | 10.60 | | | | | | | | | | | | | | | | | | - |
| | 11.00 | | 44,444 | | | | | | | | | | | | | | | | 44,444 |
| | 11.25 | 11,395 | | | | | | | | | | | | | | | | | 11,395 |
| | 11.40 | | | | | | | | | | | | | | | | | | - |
| | 11.50 | | | | | | | | | | | | | | | | | | - |
| | 11.75 | 28,908 | 9,971 | | | | | | | | | | | | | | | | 38,879 |
| | 13.00 | | | | | | | | | | | | | | | | | | - |
| | 13.25 | | | | | | | | | | | | | | | | | | - |
| **උප එකතුව** | | **125,574** | **85,424** | **87,198** | **78,195** | **137,979** | **90,384** | **73,545** | **12,615** | **52,781** | **69,540** | **9,944** | **109,447** | **177,980** | **95,892** | **119,215** | **30,676** | **-** | **1,356,389** |
| ශ්‍රී ලංකා රුපියල් ණය | | | | | | | | | | | | | | | | | | | |
| | 9.50 | | 19,600 | | | | | | | | | | | | | | | | 19,600 |
| | 11.00 | | 3,500 | | | | | | | | | | | | | | | | 3,500 |
| **උප එකතුව** | | **-** | **23,100** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | | | | | | **-** | | **23,100** |
| සාංගමික ණයකර | | | | | | | | | | | | | | | | | | | |
| එච්.ඩී.එෆ්.සී. බැංකු ණයකර | | | | | 66 | | | 195 | | | | | | | | | | | 261 |
| එස්.එම්.අයි.බී. බැංකු ණයකර | | | | | | | | 195 | | | | | | | | | | | 195 |
| සම්පත් බැංකු ණයකර | | | | | 14 | 844 | | | | | | | | | | | | | 858 |
| ලංකා බැංකු ණයකර | | | 200 | | | 576 | | | | | 134 | | | | | | | | 910 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම ණයකර | | | 500 | | | | | | | | | | | | | | | | 500 |

# සේවක අර්ථසාධක අරමුදල
## 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශනයට අදාළ සටහන්

(රු.)

| ආයෝජන කාණ්ඩය | අනුපාතය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2025 | 2026 | 2028 | 2032 | 2033 | 2043 | නිශ්චිත නොවූ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නේෂන්ස් ට්‍රස්ට් බැංකු ණයකර | | | | 1,000 | | 1,098 | | | | | | | | | | | | | 2,098 |
| ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකු ණයකර | | | | 500 | | | | | | | | | | | | | | | 500 |
| හැටන් නැෂනල් බැංකු ණයකර | | | | | | 317 | | | 2,000 | | | | | | | | | | 2,317 |
| එම්.බී.එස්.එල්. | | 163 | | | | 281 | | | | | | | | | | | | | 444 |
| පෑන් ඒෂියා බැංකු ණයකර | | | | | 250 | | | | | | | | | | | | | | 250 |
| සිංගර් ශ්‍රී ලංකා | | | 62 | 94 | | | | | | | | | | | | | | | 156 |
| ලයන් බෲවරි | | | | 40 | 40 | 53 | | | | | | | | | | | | | 133 |
| හේලීස් පී.එල්.සී. | | | | 104 | | | | | | | | | | | | | | | 104 |
| සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී. | | | | 33 | 123 | 93 | | | | | | | | | | | | | 249 |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම පී.එල්.සී. | | | | 37 | 118 | 183 | | | | | | | | | | | | | 338 |
| සෙලාන් බැංකුව | | | | | | 100 | | | | | | | | | | | | | 100 |
| පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පී.එල්.සී. | | | | | | 106 | | | | | | | | | | | | | 106 |
| නවලෝක හොස්පිට්ල්ස් | | | | | | 229 | | | | | | | | | | | | | 229 |
| එල්.බී. ෆිනෑන්ස් පී.එල්.සී. | | | | | | 221 | | | | | | | | | | | | | 221 |
| ජාතික සංවර්ධන බැංකුව පී.එල්.සී. | | | | | | 262 | | | | | 375 | 500 | | | | | | | 1,137 |
| | | | | | | | | | | | | | | | | | | | - |
| **උප එකතුව** | | **163** | **762** | **1,808** | **611** | **4,363** | **-** | **390** | **2,000** | **-** | **509** | **500** | **-** | **-** | **-** | **-** | **-** | | **11,106** |
| භාණ්ඩාගාර බිල්පත් | | 13,969 | | | | | | | | | | | | | | | | | 13,969 |
| භාරකාර සහතික | | 1,916 | 1,440 | 419 | | | | | | | | | | | | | | | 3,775 |
| ලැයිස්තුගත සාමාන්‍ය කොටස් | | | | | | | | | | | | | | | | | | 63,264 | 63,264 |
| ලැයිස්තුගත නොවන සාමාන්‍ය කොටස් | | | | | | | | | | | | | | | | | | 9,481 | 9,481 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් | | 6,627 | | | | | | | | | | | | | | | | | 6,627 |
| **මුළු එකතුව** | | **148,249** | **110,726** | **89,425** | **78,806** | **142,342** | **90,384** | **73,935** | **14,615** | **52,781** | **70,049** | **10,444** | **109,447** | **177,980** | **95,892** | **119,215** | **30,676** | **72,745** | **1,487,711** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්/ඩී/ඊපීඑෆ්/එෆ්ඒ/13    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 අප්‍රේල් 30 දින

ගරු අමාත්‍යතුමා,

කම්කරු අමාත්‍යාංශය.

**සේවක අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සේවක අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්ති ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බව මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

සමාගමක ආයෝජනය කර තිබූ රු.1,005,584,993 ක් වූ කොටස් වල වෙළෙඳපොල මිල වර්ෂ කිහිපයක සිට දිගින් දිගටම අඩුවී 2013 දෙසැම්බර් 31 දින වන විට රු. 815,640,503 කින් හෙවත් සියයට 81.1 කින් අගය අඩුවී තිබුණි. එනමුදු මූල්‍ය වත්කම් වලට සිදුවී තිබූ හානි කරන අලාභය පැහැදිලිව හඳුනාගැනීමට හැකිවන පරිදි විෂය මූලික සාක්ෂි තිබුණද ඒ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි 58 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දරන ලද අයහාර ස්වරූපයේ වියදම් රු.51,514,358 ක්, ප්‍රාග්ධනිත කර ඒ මත ක්ෂයවීම් ද සිදුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිල දී ගෙන තිබූ පිරිවැය රු.6,199,442 ක් වූ උපකරණ හා මෘදුකාංග ගිණුම් වලින් අත්හැරී තිබුණි.

### 2.2.3 නිරවුල් නොකළ ශේෂ

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2013 දෙසැම්බර් 31 දිනට රු. 7,908,504,669 ක මුදලක් පහත සඳහන් හේතුන් මත අර්ථලාභීන්ගේ ගිණුම් වලට බැර නොකිරීම හා ගෙවා නිරවුල් නොකිරීම නිසා එම අර්ථලාභීන්ට අරමුදල් අහිමි වීමට හෝ ගෙවීම් පමා වීමට හේතුවී තිබුණි. මෙම ශේෂ අප්‍රමාදව නිරවුල් නොකිරීම පිළිබඳව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින්ද හේතු විමසා තිබුණි.

(අ) කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සේවක අර්ථසාධක අරමුදලට අදාලව නඩු පැවරීමෙන් හිඟ වාරික ලෙස අයකර ගන්නා ලද රු. 5,982,176,693 ක් වූ මුදල් 2013 දෙසැම්බර් 31 දින වනවිටත් සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර කර නොතිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදල් ලෙස අර්ථලාභීන්ගේ ගිණුම්වලට බැර නොකල රු. 440,452,911 ක් වූ මුදලක් පොදු තැන්පත් ගිණුමෙ 2013 දෙසැම්බර් 31 දින වනවිටත් රඳවාගෙන තිබුණි.

(ඇ) අඩුවැඩි දායක මුදල් ගිණුමේ ශේෂය වූ රු.1,342,080,192 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකල හිමිකම් නොපාන ලද ප්‍රතිලාභ ගිණුමේ හා රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ ශේෂ පිළිවෙලින් රු. 96,173,622 ක් හා රු. 47,621,251 ක් තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සේවක අර්ථ සාධක අරමුදලින් කම්කරු දෙපාර්තමේන්තුවට ලබාදුන් රු. 757,897,367 ක් වූ ස්ථාවර වත්කම් වල පැවැත්ම, වටිනාකම හා නිවැරදිතාවය තහවුරු කිරීමට අදාල වන ස්ථාවර වත්කම් ලේඛනය, ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයේ පවතින රු. 143,252,603 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3 මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය කටයුතුවල ප්‍රතිඵලය රු. 125,609,876,616 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු. 111,828,720,196 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයෙහි රු.13,781,156,420 ක වාසිදායක වැඩිවීම කෙරෙහි ආයෝජන ආදායම් රු.14,944,888,984 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය

(i) හිඟ මුදල් අයකර ගැනීමට අනුගමනය කරන මූලික ක්‍රියාමාර්ග (නීතික්‍රියා 3 ) අනුගමනය කිරීම මාස 6 සිට වසර 2 1/2 ක් දක්වා වූ කාලයක් පමා වීම නිසා නියමිත පරිදි නඩු පැවරීමට නොහැකි වීමෙන් ආයතන 182 කට අදාල හිඟ දායක මුදල් හා අධිභාර රු. 171,992,382 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) නීතික්‍රියා 1 හා 2 යවා දින 14 කට පසු නීතික්‍රියා 3 යැවිය යුතු වුවත් ඒ සඳහා මාස 3 සිට වසර 1 දක්වා වූ කාලයක් ප්‍රමාද වී තිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර, 2014 ජූනි 30 දින වන විටත් රු. 28,742,744 ක් සඳහා හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට නීති ක්‍රියා 3 යවා නොතිබුණි.

(iii) මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් පරීක්ෂා කරන ලද ආයතන වලින් ආයතන 12 කට අදාල රු.7,171,353 ක් වූ හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිගණක දත්ත සමුදාය පද්ධතියට අනුව ආයතන 20 ක් දීර්ඝ කාලයක සිට දායක මුදල් අරමුදලට ගෙවා නොතිබුණි.

(iv) ආයතන 122 ක් දිර්ඝ කාලයක සිට කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්වී නොතිබුණු අතර පරීක්ෂා කරන ලද ආයතන පිළිබද වාර්තා විෂය භාර ලිපිකරුට භාරදීමේදී මාස 2 කට වැඩි කාල පමාවක් සිදුවී තිබුණි.

(ආ) 2004 සිට 2011 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව අරමුදල විසින් උසාවියේ නඩු පවරා අයකර ගන්නා ලද රු 83,410,920 ක් වූ මුදල කුමන කාරණයක් සඳහා පවරන ලද නඩු වලට අදාල ද යන්න 2014 දෙසැම්බර් 31 දිනය වනවිටත් පැහැදිලිව හඳුනා ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත සමුදාය පද්ධතියට අනුව අරමුදලේ ලියාපදිංචි වී ඇති ආයතන 360 කින් 2000 සිට 2013 කාල පරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතු රු. 194,273,332 ක් වූ අධිභාර 2014 අගෝස්තු අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඈ) නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ආයතන 102 කට අදාලව රු.93,423,472 ක හිඟහිටි දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට 2014 අප්‍රේල් 30 දින වනවිට ද කටයුතු කර නොතිබුණි.

(ඉ) 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව පළාත් පාලන ආයතන 169 කින් අයවිය යුතු රු. 14,379,993 ක්වූ අරමුදලේ ප්‍රමාද අධිභාර අයකර ගැනීම සඳහා නියමිත පරිදි දැන්වීම් යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ආයතන 131 කින් 2009 වර්ෂයේ සිට 2013 ජනවාරි දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල රු.114,601,542 ක්වූ හිඟ දායක මුදල් හා අධිභාර 2014 ජූනි 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඊ) අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයීය බල ප්‍රදේශයට අයත් ආයතන 68 කින් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල රු.102,112,505 ක්වූ හිඟ දායක මුදල් හා අධිභාර 2014 ජූනි 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඌ) දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රාදේශීය කාර්යාල වලින් 2014 සැප්තැම්බර් 30 දින වනවිට හිඟ දායක මුදල් ලෙස රු. 4,125,870,645 ක් ද අධිභාර ලෙස රු. 2,089,740,360 ක්ද වශයෙන් එකතුව රු. 6,215,611,005 ක් අයවිය යුතුව තිබුණි.

(එ) 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා රු.8,244,403,544 ක දායක මුදල් අයකර ගැනීම සඳහා දිවයින පුරා නඩු 10,641 ක් පවරා තිබුණි. මෙම නඩු වලින් කොපමණ මුදලක් අයවී තිබේද, නඩු කොපමණ සංඛ්‍යාවක් නිරවුල්වී තිබේ ද, යන්න තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි ලියකියවිලි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ඒ) මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයේ ප්‍රධාන රාජ්‍ය වැවිලි ආයතන දෙකකට අයත් වතු සමාගම් 31 කින් 2007 ජනවාරි 01 දින සිට 2013 ජූනි 30 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව අයකර ගතයුතු එහෙත් අරමුදලට නොගෙවා ඇති හිඟ දායක මුදල් හා ඊට අදාල අධිභාර මුදල රු.208,378,193 ක් වී තිබුණි.

(ඔ) මහනුවර දකුණ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ජනතා වතු සමාගම් 21 කින් 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු හිඟහිට ඇති දායක මුදල හා අධිභාර මුදලෙහි මුළු වටිනාකම රු. 286,729,384 ක් වී තිබුණි.

**මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2003 ජූනි 06 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තියට පටහැනිව සේවක අර්ථසාධක අරමුදලේ සේවය කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායම මත 2013 වර්ෂයේදී අයකර ගත යුතුව තිබුණු රු. 7,168,498 ක් වූ උපයන විට ගෙවීම් බදු අදාල නිලධාරීන්ගෙන් අය නොකර අරමුදල විසින් ගෙවා තිබුණි. 2011 හා 2012 වර්ෂ වලදී ද උපයන විට ගෙවීම් බදු පිළිවෙලින් රු. 5,542,066 ක් හා රු. 6,459,092 ක් අදාල නිලධාරීන්ගෙන් අය නොකර අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේද දායකත්වය ලබාගෙන රු. බිලියන 8.557 ක ඇස්තමේන්තුගත මුලු පිරිවැයකට ඉදිකරගෙන යනු ලබන "මෙහෙවර පියස" ගොඩනැගිල්ලට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය රු. බිලියන 5.147 ක් විය. 2013 දෙසැම්බර් 31 දිනට මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් අරමුදල විසින් දරා ඇති පිරිවැය රු.මිලියන 890.55 ක් හෙවත්

මුළු පිරිවැයට සියයට 10.4 ක් වූ අතර, 2012 අංක 2 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනතට අනුව ගොඩනැගිලි භූමියේ හිමිකාරත්වය අරමුදලේ නමට පවරා දියයුතු වුවද 2014 සැප්තැම්බර් 30 දින වන විටත් එසේ පවරා දී නොතිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

### 4.1.1 මෙහෙයුම් කාර්යසාධනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය අවසානයේ දී කාර්යසාධන තත්ත්වය පහත පරිදි විය.

| විස්තරය | තථ්‍ය සංඛ්‍යාව | අරමුදල් ක්‍රියාකාරිත්වයට අදාල වූ සංඛ්‍යා | ප්‍රතිශතය |
|---|---|---|---|
| පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය | 3,661,132 | 2,403,501 | 65.65 |
| සේවා යෝජකයින් | 204,777 | 69,148 | 33.77 |
| අරමුදලේ සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 15,203,073 | 2,403,501 | 15.81 |

(ප්‍රභවය : ශ්‍රී ලංකා මහ බැංකුව - සේවක අර්ථසාධක අරමුදල 2013)

වර්තමානයේ දී දායක මුදල් එවනු නොලබන අරමුදලේ අක්‍රීය සාමාජික ගිණුම් 12,799,572 කට 2013 ජනවාරි 01 දින වනවිට බැරවී ඇති මුදල රු. 602,017,524,105 ක් හා එම ගිණුම් හිමියන් වෙනුවෙන් 2013 වර්ෂය සඳහා බැර වූ පොලී මුදල රු. 66,221,927,651 ක් ද විය. මෙම අක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාව අරමුදල විසින් පවත්වා ගෙන යන මුළු ගිණුම් සංඛ්‍යාවෙන් 84.2 ක් විය.

(ආ) සාමාජිකයන් වෙත ගෙවන ලද ප්‍රතිලාභ

| වර්ෂය | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|---|---|
| ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය | 11 | 11.5 | 11.5 | 12.5 | 13.75 | 13.2 | 11.2 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011 වර්ෂයේ දී ආයෝජන ආදායම් රු. 5,049,303,683 කින් අඩුවීම හා සාමාජික අරමුදල රු. 110,734,645,618 කින් වර්ධනය වීම නිසා 2010 වර්ෂයට වඩා 2011 වර්ෂයේ දී සාමාජිකයින් වෙත ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය සියයට 1 කින් අඩුවීමට හේතුවී තිබුණු අතර 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය සියයට 0.5 කින් අඩු වී තිබුණි.

(ii) 2011 වර්ෂයේදී සියයට 11.5 බැගින් ගෙවූ සාමාජික ප්‍රතිලාභ ප්‍රතිශතය 2012 වර්ෂයේදී ද ගෙවීම සඳහා රු. 115,771,416,227 ක මුදලක් අවශ්‍ය වී තිබුණු නමුත්, එම වර්ෂයේ ආදායම් ප්‍රමාණවත් නොවීම නිසා ලාභාංශ සමකිරීමේ සංචිතයෙන් රු.5,700,000,000ක මුදලක් ආදායමට බැර කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයේදී සාමාජික ප්‍රතිලාභ සියයට 11 බැගින් ගෙවීමට ආදායම ප්‍රමාණවත් නොවීම නිසා රු. 3,700,000,000 ක මුදලක් ලාභාංශ සමකිරීමේ සංචිතයෙන් ආදායමට බැර කර තිබුණි.

(ඈ) පනතට අදාල රෙගුලාසි මාලාවක් පාර්ලිමේන්තුවෙන් අනුමත කර නොගැනීම නිසා 2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන ) පනතින් හා ප්‍රධාන පනතේ 23 වගන්තියට ඉක්බිතිව එකතු කරන ලද 23(අ) වගන්තියට අනුව පනතේ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන සාමාජිකයින්ට තමාගේ සාමාජික මුදල් ලෙස බැරට තැන්පත්ව ඇති මුදලින් සියයට 30 ක් නිවාස හා වෛද්‍යාධාර ප්‍රතිලාභ ලෙස ලබාදීමට නියම කරන ලද නමුත් එම නියමය ක්‍රියාත්මක කිරීමට 2014 ජූලි 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

(ඈ) 1998 වර්ෂයේ සිට රාජ්‍ය බැංකු හා රජයට අනුබද්ධිත ව්‍යවස්ථාපිත ආයතන 5 ක් මගින් සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. එම ණය ක්‍රමය මගින් 2000 - 2013 වර්ෂ වලට අදාල කාල පරිච්ඡේදය තුළදී ණය සහතික පත් 208,500 ක් මගින් රු.මිලියන 47,785 ක ණය ප්‍රමාණයක් අනුමත කර තිබුණු අතර, අදාල කාල සීමාව තුළදී මෙම ණය මුදල් වලින් ණය නොගෙවා පැහැර හැරි ප්‍රමාණය රු. මිලියන 16,737 ක් හෙවත් සියයට 35 ක් විය. මෙසේ ණය පැහැර හැරීම නිසා 2013 දෙසැම්බර් 31 දින වනවිට තවත් රු. මිලියන 2,500 ක් අදාල බැංකු වෙත ගෙවිය යුතුව තිබුණි.

### 4.1.2 ආයෝජන හා ආයෝජන ආදායම්

2013 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් කොටස් වෙළෙඳපොළේ සමාගම් 80 ක දිගුකාලීනව හා කෙටිකාලීනව කර තිබුණු රු. 71,690,881,118 ක් වූ සමස්ත ආයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් කොටස් වෙළෙඳපොලේ සමාගම් 80 ක කර තිබුණු රු. 71,690,881,118 ක් වූ සමස්ත දිගුකාලීන හා කෙටිකාලීන ආයෝජනයෙන් සමාගම් 61 ක කර තිබුණු රු.52,092,805,864 ක ආයෝජනය එදිනට රු.13,823,352,605 කින් පහල වැටී තිබුණි. කෙසේ වුවද 2014 ජූනි 30 දින වන විට අරමුදලේ සමස්ත කොටස් වෙළෙඳපොළ ආයෝජනය සමාගම් 93 ක රු.75,393,966,488 ක් වී තිබුණු අතර, එදිනට සමාගම් 57 ක රු.45,533,044,007 ක් වූ ආයෝජනයේ කොටස් වෙළෙඳපොළ අගය අඩුවීම රු. 9,679,212,488 ක් වී තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථ සාධක අරමුදලේ දිගුකාලීනව රු. 3,285,216,703 ක් ආයෝජනය කර තිබුණු සමාගම් 8 ක් 2013/14 ගිණුම් වර්ෂයේ දී අලාභ ලබා තිබුණු බව එම සමාගම් වල වාර්ෂික වාර්තා වලින් අනාවරණය වී තිබුණි. මෙම සාමගම් 8 න් රු.199,555,228 ක් හා රු. 711,242,903 ක් ආයෝජනය කර තිබු සමාගම් 2 ක් පසුගිය වර්ෂ 3 ක පමණ කාල සීමාවක් තුලදී දිගින් දිගටම අලාභ ලබා තිබුණි. මෙම ආයෝජන වලින් අදාල කාල සීමාව තුලදී අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල 2013 අප්‍රේල් මාසයට ආසන්න කාල සීමාවක් තුලදී පරිගණක සමාගමකින් කොටස් 11,324,228 ක් රු. 43,925,525 ක මිලකට මිලදී ගෙන තිබුණු අතර මෙසේ මිලදී ගැනීමට ප්‍රථම මෙම සමාගමේ ද්‍රවශීලතාවය පිළිබඳව සලකා බලා නොතිබුණි. මෙම සමාගම 2012/13 ගිණුම් කාල පරිච්ඡේදයේදී රු.මිලියන 478 ක අලාභයක් ලබා තිබුණු අතර සමාගම දිගින් දිගටම පවත්වාගෙන යාම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව සමාගමේ විගණකයින් පවා මතයක් පලකර තිබුණි. 2014 ජූනි 14 දින වනවිට කොටස් වෙළෙඳපොළේ දී මෙම සමාගමේ කොටස් මිල රු. 40,528,254 කින් හෙවත් සියයට 92.27 කින් පහල වැටි තිබුණි. එබැවින් මෙම සමාගමේ ආයෝජිත මුදල් ආපසු ලබාගැනීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(ඈ) කෙටිකාලීනව කොටස් වෙළෙඳපොළේ කර තිබුණු ආයෝජන මත කොටස් මිල පහල වැටීමෙන් සෘජුවම අරමුදලට දැරීමට සිදුව තිබූ අලාභය 2011 දී රු.174,077,469 ක් , 2012 දී රු.117,619,396 ක් සහ 2013 දී රු. 44,504,112 ක් ද වශයෙන් එකතුව රු. 336,200,977 ක් අදාල වර්ෂයන්හිදී ලාභයෙන් කපා හැර තිබුණි.

(ඉ) අරමුදල විසින් 2008,2009, 2010, 2011, 2012 සහ 2013 වර්ෂ අවසානයේදී පිළිවෙලින් රු.3,890,902,522, රු.6,877,822,908, රු.39,133,587,926, රු.73,948,947,927, රු.63,102,761,384 හා රු.71,690,881,118 ක් කොටස් වෙළෙඳපොලේ ආයෝජනය කර තිබුණි. එම ආයෝජනය සඳහා ලැබී තිබුණු ප්‍රතිලාභ පිළිවෙලින් සියයට 8.93 ක්ද, සියයට 22.99 ක්ද, සියයට 5.08 ක්ද, සියයට 3.58 ක්ද ,සියයට 3.77 ක් හා සියයට 4.6 ක් වී තිබුණි.

(ඊ) 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් කොටස් වෙළෙඳපොළේ සමාගම් 27 ක කර තිබුණු රු. 14,093,581,728 ක ආයෝජනය සඳහා 2014 සැප්තැම්බර් මාසය වන විටත් කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. 2011 වර්ෂයේදී හා 2012 වර්ෂයේදී පිළිවෙලින් සමාගම් 11 ක කරන ලද රු.3,555,864,821 ක හා සමාගම් 14 ක කරන ලද රු. 8,793,951,889 ක ආයෝජන සඳහා ද මෙසේ අරමුදලට ආදායම් ලැබී නොතිබුණි.

(උ) 2013 දෙසැම්බර් 31 දින වන විට සේවක අර්ථසාධක අරමුදල විසින් රු. 1,515,811,224 ක් ආයෝජනය කර තිබුණු සමාගම් 3 කින් අදාල ආයෝජන කල දින සිට 2014 ඔක්තෝබර් 31 දින වනවිටත් අරමුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. විස්තර පහත දක්වා ඇත.

(i) 2012 ජුලි මාසයේදී ගුවන් සමාගමක ඒකක 1,863,676 ක් මිලදී ගැනීමට කරන ලද රු. 500,000,000 ක ආයෝජනය වෙනුවෙන් අදාල ආයෝජනය කරන ලද දින සිට 2014 ඔක්තෝබර් 31 දින තෙක් අරමුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ii) 2011 පෙබරවාරි සිට 2011 නොවැම්බර් දක්වා කාල සීමාව තුලදී රු. 205,489,614 ක් ගෙවා මිලදීගත් මූල්‍ය සමාගමක කොටස් 5,091,200 ක ආයෝජනය සඳහා අදාල ආයෝජනය කරන ලද දින සිට අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. මෙසේ කොටස් මිලදී ගන්නා අවස්ථාව වනවිට අවසන් වරට ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශන වලින් මෙම සමාගම ලබා තිබුණු රු.4,285,937,284 ක අලාභය පිළිබඳව සලකා බලා නොතිබුණු අතර 2013/14 මූල්‍ය වර්ෂය අවසානයේදී මෙම සමාගමේ සමුච්චිත අලාභය රු. 14,340,295,995 ක් වී තිබුණි. මෙම සමාගමේ රු. 40.36 කට මිලදී ගත් කොටසක 2014 ජුනි 10 දින වන විට කොටස් වෙළෙඳපොළේ මිල රු.16.20 ක් දක්වා අගය අඩු වී තිබුණි.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2010 මැයි 05 දින ගත් තීරණයක් මත හෝටල් සමාගමක කොටස් 23,712,200 ක් සඳහා රු. 810,321,610 ක් ආයෝජනය කරන ලද දින සිට 2014 ඔක්තෝබර් 31 දින තෙක් අරමුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. මෙම සමාගමේ රු. 34.17 කට මිලදී ගත් කොටසක 2014 ජුනි 10 දින වන විට වෙළෙඳපොළේ අගය රු.13.20 ක් වී තිබුණි.

(ඌ) අලුතින් ඉදිකර ආරම්භ කිරීමට යෝජිත හෝටල් සමූහයකින් යුත් සමාගමක කොටස් මිලදී ගැනීම වෙනුවෙන් අරමුදල විසින් රු. 5,000,000,000 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි.

(එ) 2013 දෙසැම්බර් 31 දිනට අරමුදලේ රු. 71,690,881,118 ක් වූ සමස්ත ආයෝජනයෙන් හෝටල් සමාගම් 13 ක කරන ලද දිගුකාලීන හා කෙටිකාලීන ආයෝජනය රු. 9,642,243,784 ක් වූ අතර එය මුලු ආයෝජනයෙන් සියයට 13.45 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) හෝටල් ක්ෂේත්‍රයේ කරන ලද ආයෝජනය 2010, 2011, 2012 සහ 2013 වර්ෂ අවසානයේදී පිළිවෙලින් රු.3,882,771,148 රු.7,219,711,549 ක්, රු.7,746,506,674 ක් සහ රු. 9,642,243,784 ක් ලෙස වැඩි වී තිබුණු අතර එම වර්ෂවලදී ලැබී තිබුණු ප්‍රතිලාභය රු.56,326,376 ක්, රු.174,011,584 ක්, රු.151,531,857 ක් හා රු. 275,738,400 ක් විය. ඒ අනුව ආයෝජනයට ලැබී තිබුණු ප්‍රතිලාභය පිළිවෙලින් සියයට 1.45 ක්, සියයට 2.41 ක්, සියයට 1.96 ක් සහ සියයට 2.86 ක අගයක් ගෙන තිබුණි.

(ii) 2013 වර්ෂයේදී දිගුකාලීනව හා කෙටිකාලීනව රු. 3,243,292,787 ක් ආයෝජනය කර තිබුණු හෝටල් සමාගම් 8 කින් අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ඒ) කොටස් 20,942,989 ක් රු.680,232,420 කට මිලදී ගෙන තිබුණු පෞද්ගලික සන්නිවේදන සමාගමක කොටස් මිල ඉහළ ගොස් තිබුණු නමුදු එම කොටස් 2009 වර්ෂයේ සිටම කොටස් වෙළෙඳපොලේ ගනුදෙනු සඳහා යොදාගෙන නොතිබීම නිසා එම කොටස් අලෙවියෙන් ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. මෙම ආයෝජනයට 2008 හා 2009 වර්ෂවලදී සියයට 3.39 ක් බැගින් ද, 2010 වර්ෂයේදී සියයට 0.81 ක්, 2011 වර්ෂයේදී සියයට 1.67 ක්, 2012 වර්ෂයේදී සියයට 2.62 ක් හා 2013 වර්ෂයේදී සියයට 3.02 ක් වශයෙන් ද ලාභාංශ ආදායම් ලැබී තිබුණු නමුදු , එම ආදායම කරන ලද ආයෝජනයට සාපේක්ෂව ඉතා පහල අගයක් ගෙන තිබුණි.

(ඔ) 2013 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළෙඳපොළේ දී කරන ලද රු. 71,690,881,118 ක් වූ අරමුදලේ කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජනය සඳහා 2014 සැප්තැම්බර් 30 දින වන විට කොටස් වෙළෙඳපොළේ ගනුදෙනු වලින් ලැබී තිබුණු සමස්ථ ප්‍රාග්ධන ලාභය රු.1,596,584,599 ක් හෙවත් සියයට 2.23 ක් වැනි සුළු අගයක් ගෙන තිබුණි.

(ඕ) අරමුදල 2013 දෙසැම්බර් 31 දිනට නිල ලැයිස්තුගත සමාගම් 67 ක කර තිබුණු සමස්ත දිගුකාලීන ආයෝජනය රු. 71,128,266,562 ක් විය. එම ආයෝජනයෙන් එකතුව රු. 56,379,044,262 ක් සමාගම් 26 ක පමණක් ආයෝජනය කර තිබුණු අතර, එම සමාගම් වල ආයෝජන වලින් සමාගම් 19 ක් සඳහා 2014 දී සියයට 0.37 සිට සියයට 7.33 ක ආදායම් ප්‍රතිශතයක් ලැබී තිබුණි. එකතුව රු. 10,315,949,306 ක් ආයෝජනය කර තිබුණු ඉතිරි සමාගම් 7 න් අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

කම්කරු දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අරමුදලට අනුයුක්ත කර තිබූ කාර්ය මණ්ඩල තොරතුරු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථ සාධක අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 228 ක් වූ අතර එදිනට තථ්‍ය සංඛ්‍යාව 176 ක් විය. ඒ අනුව පුරප්පාඩු 52 ක් පැවතුණි.

කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින සේවක පුරප්පාඩු පිරවීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් කඩිනම් පියවරක් ගතයුතු බවට 2014 අගෝස්තු 19 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී අවධාරණය කර තිබුණි.

(ආ) සේවක අර්ථ සාධක අරමුදලේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර 2012 වර්ෂයේදී 120 ක් හා 2013 වර්ෂයේදී 138 ක් ද වශයෙන් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අනුයුක්ත කල සේවකයන්ගේ වැටුප් පිරිවැය පහත සඳහන් පරිදි විය.

| | අනුයුක්ත සේවක සංඛ්‍යාව | සේවක මණ්ඩල පිරිවැය | ඒක සේවක පිරිවැය |
|---|---|---|---|
| | | රු. | රු. |
| කම්කරු දෙපාර්තමේන්තුව | 176 | 234,664,284 | 1,333,320 |
| ශ්‍රී ලංකා මහ බැංකුව | 120 | 334,145,376 | 2,784,545 |

සේවක අර්ථසාධක අරමුදලේ කම්කරු දෙපාර්තමේන්තුවේ ඒක සේවක පිරිවැයට අනුව සසඳා බලන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ ඒක සේවක පිරිවැය සියයට 108.8 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේදී රු. 34,967,296 ක් වැය කර කම්කරු නිලධාරීන් සඳහා මිලදී ගන්නා ලද තල පරිගණක (Tablet) 395 ක් කම්කරු නිලධාරීන් හා මාණ්ඩලික නිලධාරීන් අතර බෙදා හැර තිබුණද කම්කරු පරීක්ෂණ පරිගණක ගතකිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අරමුදල ක්‍රියාවේ යෙදවීමට අදාල අභ්‍යන්තර විගණනය, කම්කරු දෙපාර්තමේන්තුව මගින් සිදුකර තිබුණි. කෙසේ නමුත් සේවක මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා අරමුදලේ සීමිත කොටසක් පමණක් ආවරණය කර තිබුණි. එමෙන්ම අරමුදල් පාලනයට අදාල අභ්‍යන්තර විගණනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෞද්ගලික විගණන සමාගමකට පවරා දී තිබුණු අතර ඒ සඳහා 2013 වර්ෂයේ දී ගෙවා තිබුණු විගණන ගාස්තුව රු. 6,494,880 ක් වී තිබුණි.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2011 වර්ෂයේදී වාර්තා කරන ලද නමුත් මේ දක්වා නොවිසඳී පවතින ප්‍රධාන විගණන ඡේද කිහිපයක් පහත දැක්වේ.

(අ) උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයත් ක්‍රියාකාරී සේවායෝජක ආයතන 7543 කින් ආයතන 4911 ක් හෙවත් ආයතන සංඛ්‍යාවෙන් සියයට 65 ක් වර්ෂයකට වැඩි කාලයක සිට කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක් වී නොතිබීම.

(ආ) අධිකරණ ක්‍රියාමාර්ග අතරමග නැවතීම නිසා දිස්ත්‍රික් කම්කරු කාර්යාල 2 කට අයත් සේවා යෝජක ආයතන වලින් අයකර අළුතින් සාමාජික ගිණුම් වලට බැරවිය යුතු රු. 87,546,668 ක දායක මුදල් හා අධිභාර 2014 මැයි 31 දින වන විටත් අයකර නොතිබීම.

(ඇ) මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයත් සේවායෝජක ආයතන වලින් අරමුදලට අයවිය යුතු රු. 176,215,549 ක හිඟ දායක මුදල් හා අධිභාර 2014 මැයි 31 දින වන විටත් අයකර නොතිබීම.

(ඈ) මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය මගින් සේවක අර්ථසාධක දායක මුදල් අයකර ගැනීමට පවරා තිබුණු නඩු 2 කට වරෙන්තු නිකුත් කර තිබුණද ඉදිරි කටයුතු ක්‍රියාත්මක නොවීම නිසා රු. 1,692,078 ක සේවක අර්ථසාධක දායක මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබීම.

(ඉ) ප්‍රමාණවත් තොරතුරු අධිකරණයට ඉදිරිපත් නොකිරීම හා තොරතුරු යාවත්කාලීන නොවීම මත අවසන් නොවූ අධිකරණ ක්‍රියාමාර්ග 20 ක් හේතුවෙන් රු. 9,255,876 ක් වූ දායක මුදල් අයකර ගැනීමට 2014 ජූනි 30 දින වන විටත් අපොහොසත් වී තිබීම.

(ඊ) 2010 වර්ෂයේදී අරමුදල විසින් ආරම්භ කළ සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අවසන් වී නොතිබීම සහ ඒ සඳහා වූ යන්ත්‍රසූත්‍ර වලට හා කොන්ත්‍රාත්කාර සමාගමට රු. 14,528,546 ක් ගෙවා තිබීම.

(උ) 1995 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාල සීමාව තුල අවසන් වූ නඩු වලින් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය මගින් අයකළ රු. 16,803,661 ක් වූ දායක මුදල් හා අධිභාර මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගෙන නොතිබීම.

(ඌ) 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළදී අරමුදලේ සාමාජිකයින්ගේ දායක හා අධිභාර වශයෙන් නඩු මගින් අයකළ රු. 62,571,668 ක් වූ මුදල අදාල සාමාජිකයින් පිළිබඳව නිවැරදි තොරතුරු අරමුදල සතුව නොමැති වීම නිසා එම මුදල් ඔවුන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර නොකර රාජ්‍ය ආදායමට බැර කර තිබීම.

(එ) මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ආයතන වලින් දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට නඩු පවරා අධිකරණ ක්‍රියාමාර්ග නොගැනීම, නඩු පවරා තිබුණද ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම, වාරික පහසුකම් ලබාදුන් ආයතන ගෙවීම් පැහැර හැරීම, ආයතන ඇවර කිරීමට පෙර දායක අරමුදල් අයකර නොගැනීම, අරමුදලේ අවිනිශ්චිත ගිණුමේ තැන්පත් කර ඇති මුදල් නිවැරදි සී වාර්තා ලබා දී නිරවුල් නොකිරීම, 2003 - 2006 කාල සීමාව තුළ ලැබී තිබූ දායක මුදල් හා අධිභාර නියමිත සාමාජික ගිණුම් වලට බැර නොකිරීම සහ ප්‍රමාද අධිභාර අයකර නොගැනීම හා සම්බන්ධ රු. 313,452,501 ක් පිළිබඳව වාර්තා කරන ලද විගණන විමසුමට හා එම කරුණු ඇතුළත් කරන ලද 2009 විගණකාධිපති වාර්තාවේ 3.2.5 ඡේදයේ (ඇ) හා 2010 විගණන වාර්තාවේ 3.2.1 (ඇ) (iii) වගන්ති වලින් දක්වන ලද කරුණු වලට අදාල විමර්ශනයන් සිදු කර පිළිතුරු සපයන බව දක්වා තිබුණ ද 2014 අප්‍රේල් 30 දින වනවිටත් ඊට පිළිතුරු සපයා නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති පාලන වල අඩුපාඩු කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

### (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව

(i) ආයෝජන

(ii) මෙහෙයුම් කටයුතු බාහිර පාර්ශවයන්ට පැවරීම

**(ආ) කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය**

---

(i) ගිණුම්කරණය

(ii) දායක හා අධිභාර මුදල් අයකර ගැනීම

(iii) ස්ථාවර වත්කම්

(iv) සේවායෝජක ආයතන පරීක්ෂාව

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)